# THE WHITE HACKLE

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

இலங்கை காலாட் படை சஞ்சிகை

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

www.lightinfantry.lk



77 2013 JULY





# රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ ප්‍රධාන මාණ්ඩලික නිලධාරි
# ලුතිනන් කර්නල්
# ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ





රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ දෙවන වරට පත් වූ ප්‍රධාන මාණ්ඩලික නිලධාරි සිය තනතුරේ රාජකාරි භාරගත් මොහොතේ කැමරා කාචයේ සනිටුහන් වූ මොහොත.

## සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්...!



7 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/63017 ලුතිනන් කර්නල් එම්පීඑස්පී
කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ

17 (සෙවි) ශ්‍රීලපාහ අණදෙන නිලධාරි
නි/4480 මේජර්
ජේඑච්එම්එස්එස් ජයසුන්දර ශ්‍රීලපාහ





11 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/63668 මේජර්
ඩබ්ලිව්ඩී ධර්මසිරි ශ්‍රීලපාහ



රෙජිමූබ ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි
නි/64100 මේජර්
ඒසීසී අබේසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ



5 (සෙවි) ශ්‍රීලපාහ දෙවන අණදෙන
නිලධාරි නි/5295 මේජර්
එන්බීච්යුකේ නිශ්ශංක ආර්එස්පී ශ්‍රීලපාහ

# THE WHITE HACKLE

**77th Issue July 2013** www.lightinfantry.lk

Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry


## CONTENTS


| | PAGE |
|---|---|
| අදහස් උදහස් හා විවේචන | 02 |
| සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරවය දැක්වීම සඳහාය | 03 |
| BATTLE OF KURSK | 04 – 05 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 06 |
| විසිදෙවන සේනාවිධායක | 07 |
| සේවාවනිතා පුවත් | 08 – 09 |
| විශේෂ සමරු කළාපයක් එළි දැක්වීම | 10 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 11 – 19 |
| ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති | 20 – 21 |
| යුද්ධ හමුදාධිපතිතුමන් 4 ශ්‍රීලපාහ වෙතින් උණුසුම් පිළිගැනීමක් | 22 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 23 – 28 |
| ක්‍රීඩා පුවත් | 29 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 30 |
| උතුරත් දකුණත් යා කළ මල් හී සර | 31 |
| උපන්දින සුබ පැතුම් | 32– 33 |
| සුබ මොහොතින් නව තනතුරටපත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් | 34 |
| ශ්‍රීලපාහ ඒකක පුවත් | 35 – 37 |
| තල් අරබේ සිට | 38 |
| දසුනේ හසුන | 39 |
| ප්‍රහේලිකා අංක 56 | 39 – 40 |




06 තවත් පාබල තරුවක්



16 වියපත් වුවත් නැත ඔබ අමතක අපට



28 ජවයෙන් පෙරටම ආ විරුවෝ




### කවරයේ කථාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ නව රෙජිමේන්තු අධිපති වශයෙන් දෙවන වරටත් පත් වූ මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී නව තනතුරේ වැඩ භාරගැනීම නිමිති කොටගෙන 2013 සැප්තැම්බර් මස 16 දින උත්සවයක් සංවිධානය කළේය. ඒ අනුව නව රෙජිමේන්තු අධිපතිතුමන් වෙත රෙජිමේන්තුව වෙතින් කඳවුරු සම්මාන මුරයක් හා වර්ණ ධජ, රෙජිමේන්තු මංගල හස්තියා ඇතුලුව සම්මාන පෙළපාළියක් පිරිනමා පිළිගත් අවස්ථා කැමරා කාචයේ සනිටුහන මෙවර විදහා දක්වේ.


Printed by

Lettra Graphic Printers,
44/1, Negombo Road, Welisara.
Tel : 011 2234191, 0777526922
email - lettrafj@gmail.com

THE WHITE HACKLE

77th ISSUE - JULY 2013


# THE WHITE HACKLE

SRI LANKA

LIGHT INFANTRY QUARTERLY


Colonel of The Regiment

Maj Gen KADA Karunasekara RSP USP psc

Centre Commandant SLLI

Col CD Weerasuriya RSP

Chief of Staff RHQ SLLI

Lt Col AS Wickramasena RWP RSP psc SLLI

Adjutant RHQ SLLI

Maj AB Dodamwela SLLI

**The White Hackle Editors**

Chief Consultant

Maj Gen KADA Karunasekara RSP USP psc

Editor in Chief

Col CD Weerasuriya RSP

Assistant Editors

Maj AB Dodamwela SLLI

Maj KKIA Kumara SLLI

(Officer In Charge )

Honourary Consultants

Lt Gen RMD Rathnayake WWV RWP RSP USP ndu psc

(Commander of the Army)

Maj Gen HV Athukorale VSV psc FBIM

(Rtd – Reg Force)

Brig AER Abeyesinghe KSV

(Rtd – Vol Force)

Computer Type setting & Designed

C/SGT Gunasiri SHIUK



Publisher - Regimental Centre
Sri Lanka Light Infantry

Telephone - 0112 - 855204
0112 - 855356 - 60

Ext - 57656

Fax - 0112 - 855204

E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com

Website - www.lightinfantry.lk


## Feedback

### අදහස්, උදහස් හා විවේචන
### Readers Please Write in

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 77th issue. This quarterly is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **WHITE HACKLE** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to **" THE WHITE HACKLE "** We are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien"," I Serve"**. Let **'White Hackle'** be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

-Editor-

## කතු වැකිය

" වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව සහ පළිගැනීමේ මුලධර්ම මත පදනම් වූ රුදුරු අමානුෂික ත්‍රස්තවාදය මානුෂීය මෙහෙයුම තුළින් ජයගනු ලැබුයේ එක් අතකින් ගිණි අවිය ද, අනෙක් අතින් මානව හිමිකම් ප්‍රඥප්තියද, උරහිස මත මුදවා ගනු ලැබූ අහිංසක සිවිල් ජනතාවද, හදවතේ ආදරය, දයාව, අනුකම්පාව, මෛත්‍රිය සහ සෙනෙහස පුරවා ගත් අපගේ නිර්භීත සොල්දාදුවායි."

සංකල්ප වනාහී යමෙක් තම ජීවිතය තුළදී රඳවා තබාගෙන ඇති සුවිශේෂී අත්දැකීම් පර් කල්පනය තුළ තර්කනය කිරීමෙන් අනතුරුව පොදුවේ භාවිතා කිරීමට හැකි පරිදි වෘත්තීකරණය සඳහා අදහස් ඉදිරිපත් කිරීමයි. රටේ සේනාධිනායකගේ ඉහත දැක් වූ සංකල්පයෙහි අනුගත වෙමින් තම ආයතනයේ සාමාජිකයින්ගේ අභිවෘර්දිය සඳහා නව යුද්ධ හමුදාධිපතිතුමන් මේ වන විටත් රැගෙන ඇති ක්‍රියාමාර්ග බොහෝ සෙයින් අගය කළ යුතුව ඇත. තවද, එම උදාර සංකල්ප අනුව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන් නව රෙජිමේන්තු අධිපතිතුමන් විසින් ඉදිරියට ගෙනයාම බුද්ධිමත් භාවයේ ලක්ෂණයන් වේ.

1789 වර්ෂයේ ඇති වූ ප්‍රංශ විප්ලවය ස්මරණය කිරීම සඳහා පැරිසියේ ඉදිකර ඇති අයිෆල් කුළුනද, ශ්‍රේෂ්ඨ සංකල්පයක ප්‍රතිඵලයකි. "උදාරයි ඔබ" සංකල්පය යටතේ විශ්ව ශක්තිය කැටිකොට ගෙන නිදහස් මාවතක් තේමාව වශයෙන් ගෙන දැනට ඉදි කරමින් පවතින ශ්‍රී ලංකා පාබල හමුදා ස්මාරකයද, අනාගතයේ ජාත්‍යන්තර තලයේද පැසසුමට ලක්වන සිතුවම් සහ මූර්ති සාහිත්‍යයද එක් තැන් වූ විරල ඝනයේ සංකල්ප සමුදායක් ප්‍රතිමූර්තිමත් කරන අනඟි නිර්මාණයක් වනු නිසැකය.

ප්‍රෞඪ ඉතිහාසයක උරුමයන් " සේවය කරමි " යන උදෘත පාඨය යටතේ ක්‍රියාවට නැංවීම පාබල හමුදා සාමාජිකයින් ලෙස අප සැමගේ වගකීමක් බව අපගේ රුධිරයේ සනිටුහන් වී ඇති අතර, ඒ වගකීම හැකි අයුරින් ඉටු කිරීම සඳහා උරදීම සිදු විය යුත්තකි.


The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

සේවයේ යෙදී සිටියදී මියගිය රණවිරුවන්ට ගෞරව දැක්වීම සඳහාය

## IN HONOUR OF THOSE SLLI HEROES WHO MADE THE SUPREME SACRIFICE

**1983** වසරේ සිට මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් දිවි පුද කළ ශ්‍රීලපාහ විරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් ඔවුන්ගේ නාමලේඛනය **1999** ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3651 | S/208425 | L/Cpl | Gunasekara AMPS | 20 SLLI | Pudukudierippu | 19/03/2009 |
| 3652 | O/317367 | Lt | SM Jagath SLLI | 20 SLLI | Pudukudierippu | 19/03/2009 |
| 3653 | S/5D02767 | L/Cpl | Jayasinghe JNL | 20 SLLI | Pudukudierippu | 19/03/2009 |
| 3654 | S/23Q00031 | L/Cpl | Rathnayaka RMW | 20 SLLI | Pudukudierippu | 19/03/2009 |
| 3655 | S/319591 | Cpl | BandaraPMN | 10 SLLI | Pudukudierippu | 20/03/2009 |
| 3656 | S/312124 | Cpl | Aberathna AKS | 20 SLLI | Pudukudierippu | 20/03/2009 |
| 3657 | S/206867 | L/Cpl | Perera KW | 20 SLLI | Gen: Hosp: ANP | 20/03/2009 |
| 3658 | S/302219 | Cpl | Sarath KumaraRM | 1 SLLI | Chalei | 20/03/2009 |
| 3659 | S/318512 | Sgt | Ranawaka raJ | 11 SLLI | Pudukudierippu | 20/03/2009 |
| 3660 | S/203165 | L/Cpl | Sampath RC | 11 SLLI | Pudukudierippu | 20/03/2009 |
| 3661 | S/210524 | L/Cpl | Lakmal KGW | 11 SLLI | Pudukudierippu | 21/03/2009 |
| 3662 | S/311806 | L/Cpl | Herath HMPK | 11 SLLI | Pudukudierippu | 21/03/2009 |
| 3663 | S/315155 | Cpl | Yasarathna AG | 1 SLLI | Gen: Hosp: ANP | 21/03/2009 |
| 3664 | S/164145 | L/Cpl | Silva SMI | 1 SLLI | Chalei | 21/03/2009 |
| 3665 | S/44292 | L/Cpl | Bandara DKGRW | 20 SLLI | Pudukudierippu | 22/03/2009 |
| 3666 | S/175738 | L/Cpl | Buddadasa EM | 1 SLLI | Gen: Hosp:ANP | 22/03/2009 |
| 3667 | S/316036 | Sgt | Ranjith U | 1 SLLI | Gen: Hosp:ANP | 22/03/2009 |
| 3668 | S/171033 | Cpl | Dissanayaka DMB | 20 SLLI | Pudukudierippu | 23/03/2009 |
| 3669 | S/201785 | L/Cpl | Mahesh Prasanna OV | 20 SLLI | Pudukudierippu | 23/03/2009 |
| 3670 | S/208901 | L/Cpl | Lasantha WM | 20 SLLI | Ja/pura Hospital | 23/03/2009 |
| 3671 | S/43709 | L/Cpl | Wijetunga HMH | 20 SLLI | Pudukudierippu | 23/03/2009 |
| 3672 | S/319731 | L/Cpl | Prasad SPV | 20 SLLI | Pudukudierippu | 23/03/2009 |
| 3673 | S/208468 | L/Cpl | Wimalatunga WDMP | 20 SLLI | Pudukudierippu | 23/03/2009 |
| 3674 | S/195658 | L/Cpl | Fernando W | 20 SLLI | Pudukudierippu | 23/03/2009 |
| 3675 | S/319965 | Cpl | Kumarasiri HK | 11 SLLI | Pudukudierippu | 24/03/2009 |
| 3676 | S/43718 | L/Cpl | Gihan Kumara WVD | 20 SLLI | Pudukudierippu | 24/03/2009 |
| 3677 | S/306311 | Sgt | Ajith Kumara M | 20 SLLI | Pudukudierippu | 24/03/2009 |
| 3678 | S/210805 | L/Cpl | Karunarathna DMU | 20 SLLI | Pudukudierippu | 24/03/2009 |
| 3679 | S/43541 | L/Cpl | Sadanayaka NGRK | 20 SLLI | Victory Hospital | 26/03/2009 |
| 3680 | S/309452 | Sgt | Siripala SM (RSP) | 20 SLLI | Pudukudierippu | 27/03/2009 |
| 3681 | S/198506 | L/Cpl | Basnayaka BMMSK | 11 SLLI | Pudukudierippu | 27/03/2009 |
| 3682 | S/176559 | L/Cpl | Shanaka Asanka ASD | 20 SLLI | Pudukudierippu | 28/03/2009 |
| 3683 | S/197407 | L/Cpl | Nandasena PK | 20 SLLI | Pudukudierippu | 28/03/2009 |
| 3684 | S/185565 | L/Cpl | Maduranga DN | 20 SLLI | Pudukudierippu | 28/03/2009 |
| 3685 | S/44224 | L/Cpl | Bandara RMGAT | 20 SLLI | Pudukudierippu | 28/03/2009 |
| 3686 | S/213965 | L/Cpl | Dissanayaka DHMSI | 11 SLLI | Pudukudierippu | 29/03/2009 |
| 3687 | S/197209 | L/Cpl | Randika WM | 20 SLLI | Pudukudierippu | 29/03/2009 |
| 3688 | S/319980 | L/Cpl | Kumara TMS | 11 SLLI | Pudukudierippu | 29/03/2009 |
| 3689 | S/196944 | L/Cpl | Nuwan Kumara DD | 11 SLLI | Pudukudierippu | 30/03/2009 |
| 3690 | S/210715 | L/Cpl | Wijetunga TTSK | 11 SLLI | Pudukudierippu | 30/03/2009 |
| 3691 | S/204306 | L/Cpl | Wasantha HGR | 11 SLLI | Gen: Hosp: CBO | 30/03/2009 |
| 3692 | S/212656 | L/Cpl | Chaminda Kumara D | 11 SLLI | Gen: Hosp: CBO | 31/03/2009 |
| 3693 | S/44252 | L/Cpl | Thilakarathna UAA | 11 SLLI | Pudukudierippu | 31/03/2009 |
| 3694 | S/187380 | L/Cpl | Bogahalanda BLAG | 11 SLLI | Pudukudierippu | 01/04/2009 |
| 3695 | S/164060 | L/Cpl | Darshena Kumara UDL | 11 SLLI | Pudukudierippu | 01/04/2009 |
| 3696 | S/170406 | L/Cpl | Chandima KDR | 11 SLLI | Pudukudierippu | 01/04/2009 |
| 3697 | S/212283 | L/Cpl | Kulasinghe KPTD | 11 SLLI | Pudukudierippu | 01/04/2009 |
| 3698 | S/212517 | L/Cpl | Sampath KKI | 11 SLLI | Pudukudierippu | 03/04/2009 |
| 3699 | S/210659 | L/Cpl | Wijesinhe NRGEM | 7 SLLI | Gen: Hosp: CBO | 03/04/2009 |
| 3700 | S/300435 | Sgt | Jayatissa AS | 7 SLLI | Udayaram Kattu | 05/04/2009 |

තව කොටසක් ලබන කලාපයේ

# BATTLE OF KURSK




The Battle of Kursk was a World War II engagement between German and Soviet forces on the Eastern Front near Kursk (450 kilometers or 280 miles southwest of Moscow) in the Soviet Union in July and August 1943. The German offensive was code-named Operation Citadel and led to one of the largest armoured clashes in history, the Battle of Prokhorovka. The German offensive was countered by two Soviet counteroffensives, Operation Polkovodets Rumyantsev and Operation Kutuzov. For the Germans, the battle represented the final strategic offensive they were able to mount in the east. For the Soviets, the decisive victory gave the Red Army the strategic initiative for the rest of the war.

The Battle of Kursk was the first time a German strategic offensive had been halted before it could break through enemy defences and penetrate to its strategic depths. Though the Soviet Army had succeeded in winter offensives previously, their counter-offensives following the German attack were their first successful strategic summer offensives of the war.


Hitler's Operational Order No. 6, issued 15 April, called for the Kursk offensive operation to begin on 3 May or shortly thereafter. Kurt Zeitzler, the OKH Chief of Staff, provided the logistical planning for the operation. Zeitzler was a resourceful organizer of strategic moves, and had an exceptional capacity to solve movement problems. For the plan to succeed it was deemed essential to attack before the Soviets had a chance to prepare extensive defenses or launch an offensive of their own. The plan was code named Unternehmen Zitadelle (Operation Citadel). The operation envisioned a double envelopment with pincers originating from the bases of the salient and directed at Kursk which would surround the majority of the Soviet defenders and seal off the salient. Kluge's Army Group Centre was to provide General Walter Model's 9th Army to form the northern pincer and cut down through the northern face of the salient, driving to a location to the hills east of Kursk, securing the rail line from Soviet attack.

In 1943, an offensive by the Soviet Central, Bryansk, and Western Fronts against Army Group Centre was abandoned shortly after it began in early March, when the southern flank of the Central Front was threatened by Army Group South. Soviet intelligence received information about German troop concentrations spotted at Orel and Kharkov as well as details of an intended German offensive in the Kursk sector through the Lucy spy ring in Switzerland. The Soviets verified the intelligence via their spy in Britain, John Cairncross at the Government Code and Cypher School at Bletchley Park, who clandestinely forwarded raw decrypts directly to Moscow. Anastas Mikoyan wrote that on 27 March 1943 he was notified by Stalin about a possible German attack in the Kursk sector. Stalin and some senior officers were eager to strike first once the rasputitsa ended, but a number of key officers, including Deputy Supreme Commander Georgiy Zhukov, recommended a strategic defensive before going on the offensive.

According to a Soviet General Staff report, 29 of the 35 major Luftwaffe raids on Soviet airfields in the Kursk sector in June 1943 were on dummy airfields. So successful were Soviet efforts at deception that German estimates issued in mid-June placed total Soviet armoured strength at 1,500 tanks. The result was not only a vast underestimation of Soviet strength, but a misperception of Soviet strategic intentions.

When the Red Army launched their counteroffensive in the north, the German 2nd Panzer Army was attacked by two Soviet Fronts: Bryansk and Western Front. The 107,000 men of the 2nd Panzer Army and some reinforcements in the south brought the Wehrmacht troops to approximately 950,000 men (approximately 650,000 combat soldiers). The two Soviet Fronts brought the Red Army to 2,629,458 men (1,987,463 combat soldiers).

## Overview of sub-operations




## Operation along the northern face

Model's main attack was delivered by XLVII Panzer Corps, to which was also attached 45 Tigers of the 505 Heavy Tank Battalion.[160] Covering the left flank of the main attacking corps was XLI Panzer Corps, to which was attached a regiment of 83 operational Ferdinand tank destroyers, and covering the right flank was XLVI Panzer Corps, which was only a panzer corps in name – consisting of four infantry divisions and just nine tanks and 31 assault guns.[160] To the left of XLI Panzer Corps was XXIII Army Corps which consisted of a reinforced assault infantry division – the 78th – with two regular infantry divisions. The corps had no tanks, but it did have 62 assault guns. Therefore from west to east, the 9th Army's attacking force was positioned as follows: XLVI Panzer Corps, XLVII Panzer Corps, XLI Panzer Corps and XXIII Army Corps. Opposing the 9th Army was the Central Front, deployed in three main heavily fortified defensive belts.

Von Manstein's Army Group South was equipped with more armoured vehicles, infantry and artillery than von Kluge's Army Group Centre to the north. The 4th Panzer Army and Army Detachment "Kempf" had 1,377 tanks and assault guns, while the 9th Army possessed 988 tanks and assault guns.

At around 04:00 the German attack commenced with a preliminary bombardment. Mainstein's main attack was delivered by Hoth's 4th Panzer Army. Manstein organized his attacking formations into densely concentrated spearheads. Opposing the 4th Panzer Army was the Soviet 6th Guards Army, which was composed of the 22nd Guards Rifle Corps and 23rd Guards Rifle Corps. The Soviets had constructed three heavily fortified defensive belts to slow and weaken the attacking armoured forces. Though they had been provided superb intelligence, the Voronezh Front headquarters had still not been able to pinpoint the exact location where the Germans would place their offensive weight.

The 3rd SS Division, operating as the right flank of II SS Panzer Corps made very limited progress, which meant that the corps' developing penetration was precarious. The division managed to isolate the 155th Guards Regiment of the 52nd Guards Rifle Division (of the 23rd Guards Rifle Corps) from the rest of its parent division, but attempts to sweep the regiment eastward into the flank of the neighbouring 375th Rifle Division (of the 23rd Guards Rifle Corps), failed when the regiment was reinforced by the 96th Tank Brigade. The advance of the 3rd SS Division was impeded by a tributary of the Donets river. Hausser, the commander of II SS Panzer Corps, requested aid from the III Panzer Corps to his east, but III Panzer Corps was unable to assist as it was facing serious challenges of its own. By the end of 5 July, the 3rd SS Division's attainment was short of expectation, leaving the right flank of the 2nd SS Panzer Division exposed.



# 1 ශ්‍රීලපාහ පුවත්

## ඒකකය බැබළවූ පාබල තරුවක්

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචි රිදීගම පරම්පරාවෙන් පැවතගෙන එන මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ ඇසළ මහා පෙරහැර වෙනුවෙන් හේවිසි වාදනය කරන අසුරනන්ද පනික්කියලාගේ අසුරනාද සහ උඩහ ගෙදර විමලාවති යන දෙපළගේ දෙටුපුත් අසුරනන්ද පනික්කියලාගේ ජගත් ආනන්ද වර්ණසූරිය 1 ශ්‍රීලපාහ ඒකකයේ සේවයේ යෙදී සිටියි.

සෙ/330704 සාමාන්‍ය සෙබළ වර්ණසූරිය ඒපීජේජේ 1987 මැයි මස 27 වන දින රිදීගම දිසා රෝහලේදී උපත ලබා සිප් සතර හැදෑරීම සඳහා රිදී විහාරය කණිෂ්ඨ විද්‍යාලය වෙතින් අපොස (සාːපෙළ) දක්වා හැදෑරීමෙන් අනතුරුව අපොස (උːපෙළ) රඹඩගල්ල මධ්‍ය මහා විද්‍යාලය තෝරා ගෙන එහිදී කලා අංශයෙන් සිප් සතර හදාරා ඇත.

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උːපෙළ) විභාගයට පෙනී සිටියද විශ්ව විද්‍යාල වෙත ඇතුලත්වීමට අවස්ථාවක් නොලැබූ මොහු තමාගේ ජීවන ගමන සාර්ථකව ඉදිරියට ගෙනයාමට 2010 දෙසැම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා පාබල රෙජිමේන්තුව වෙත ආධුනික සෙබළෙකු වශයෙන් බැඳී පාබල රෙජිමේන්තු පුහුණු පාසල බූස්ස වෙතින් ආධුනික පාඨමාලා අංක 81 සාර්ථකව හදාරා 2011 අගෝස්තු මස 06 වන දින විසිරයන ලදී. ඉන් අනතුරුව ප්‍රෞඪ ඉතිහාසයක් ඇති පාබල රෙජිමේන්තුවේ 1 ශ්‍රීලපාහ ඒකකයට එක් විය. දැනට මොහු රෙජිමේන්තු තූර්ය වාදක කණ්ඩායමේ නර්තන අංශයේ සාමාජිකයෙකු වශයෙන් රාජකාරි කරනු ලබයි.

කුඩා කළ සිටම නර්තනයට හා හේවිසි වාදනය සඳහා දස්කම් දැක්වූ මොහු පියාගේ අඩි පාරේ යමින් දළඳා මාළිගාවේ ඇසළ මහා පෙරහැරේ හේවිසි වාදනය සඳහා පියාට අත්වැලක් වෙමින් පරම්පරාවෙන් පැවත එන හේවිසි වාදනයේ තම ඉදිරි පරම්පරාව රැගෙන යාම පිණිස ගමන් මාර්ගය සාදා ගන්නා ලදී.

**2003 වර්ෂය**

සමස්ත ලංකා නර්තන තරඟාවලිය (පාසල්) ගැට බෙර වාදනය දෙවන ස්ථානය (ජාතික මට්ටම)

**2004 වර්ෂය**

සමස්ත ලංකා නර්තන තරඟාවලිය (පාසල්) ගැට බෙර වාදනය ප්‍රථම ස්ථානය (ජාතික මට්ටම)

**2006 වර්ෂය**

ජනාධිපති සම්මාන මහනුවර ඇසළ පෙරහැර - නැගී එන තම්මැට්ටම් වාදන ශිල්පි

**2007 වර්ෂය**

ප්‍රවේනි ජාතික නර්තන තරඟාලිය (විවෘත) තම්මැට්ටම වාදනය ප්‍රථම ස්ථානය (ජාතික මට්ටම)

ජනාධිපති සම්මාන මහනුවර ඇසළ පෙරහැර - හොදම නැගී එන තම්මැට්ටම් වාදන ශිල්පි

**2008 වර්ෂය**

ජනාධිපති සම්මාන මහනුවර ඇසළ පෙරහැර - කුසලතා පූර්ණ තම්මැට්ටම් වාදන ශිල්පි

සමස්ත ලංකා නර්තන තරඟාවලියේ (පාසල්) ගැට බෙර වාදනය ප්‍රථම ස්ථානය (ජාතික  මට්ටම)

යෞවන සම්මාන උළෙල - තම්මැට්ටම් වාදනය ප්‍රථම ස්ථානය

**2009 වර්ෂය**

යෞවන සම්මාන උළෙල - තම්මැට්ටම් වාදනය ප්‍රථම ස්ථානය

ජනාධිපති සම්මාන මහනුවර ඇසළ පෙරහැර - කුසලතා පූර්ණ හොදම තම්මැට්ටම් වාදන ශිල්පි

**2010 වර්ෂය**

ජනාධිපති සම්මාන මහනුවර ඇසළ පෙරහැර - හොඳම තම්මැට්ටම් වාදන ශිල්පි

යෞවන සම්මාන උළෙල - තම්මැට්ටම් වාදනය ප්‍රථම ස්ථානය සහ දවුල් වාදනය දෙවන ස්ථානය



යුද්ධ හමුදාව හා එක්ව රාජකාරි කළද තමාගේ හැකියාවන් හා දස්කම් ඔප්නන්වමින් 2011 වර්ෂය සහ 2012 වර්ෂයන් වෙනුවෙන් මහනුවර ඇසළ මහ පෙරහැරේදී සහ කැළණි විශ්ව විද්‍යාලයේදී පැවති තරගයන් හා ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වන යෞවන සම්මාන උළෙල සඳහා සහභාගි වෙමින් සම්මාන වලින් පිදුම් ලැබීමට සමත්වන ලදී. ඒකකයට මෙන්ම පාබල හමුදා රෙජිමේන්තුවටත් සමස්ත යුද්ධ හමුදාවටත් කීර්තියක් හා අභිමානයක් ගෙනදීමට සමත් වන ලදී.

**2011 වර්ෂය**

බිහිදොර අබියස විශ්ව විද්‍යාල තරඟාවලිය (කැළණිය)

| | |
|---|---|
| තම්මැට්ටම් වාදනය | - ප්‍රථම ස්ථානය |
| දවුල් වාදනය | - ප්‍රථම ස්ථානය |
| ගැට බෙර වාදනය | - ප්‍රථම ස්ථානය |

ජනාධිපති සම්මාන මහනුවර ඇසළ මහ පෙරහැර - විශිෂ්ට තම්මැට්ටම් වාදන ශිල්පි

**2012 වර්ෂය**

ජනාධිපති සම්මාන මහනුවර ඇසළ මහ පෙරහැර - විශිෂ්ට තම්මැට්ටම් වාදන ශිල්පි

යෞවන සම්මාන උළෙල

තම්මැට්ටම් වාදනය ප්‍රථම ස්ථානය

දවුල් වාදනයේ ප්‍රථම ස්ථානය

තමා විසින් මේ දක්වා හිමිකර ගන්නා ලද සම්මාන 2013 වසරේ සහ ඉදිරියටද හිමිකර ගැනිමට ඉමහත් බලාපොරොත්තුවක් තබාගෙන සිටින මෙම පාබල තරුව වෙත 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් එක්කරන අතර, මොහුට සහ මෙවැනි පුතෙකු  පාබල හමුදාවට සහ සමස්ත යුද්ධ හමුදාවට දයාද කළ දෙමාපියන් හට සියලු දෙවියන්ගේ දේව ආරක්ෂාව දළඳා සමිඳුන්ගේ පිහිට නිරන්තරයෙන්ම ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.



**මූලස්ථානය - 1 ශ්‍රීලපාහ**







# රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ විසි දෙවන සේනාවිධායක කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ විසි දෙවන සේනාවිධාය ලෙසින් කර්නල් සීඩී වීරසූරිය ආර්එස්පී 2013 අගෝස්තු මස 26 දින යෙදුනු සුබ මොහොතින් තනතුරේ රාජකාරි ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා යුද හමුදාවට ආධුනික කෙඩෙට් නිලධාරියෙකු ලෙස එක් වන්නේ 1987 ඔක්තෝබර් මස 27 දිනය. මූලික යුද හමුදා පුහුණුව දියතලාව යුද හමුදා විද්‍යා පීඨයෙන් හැදෑරීමෙන් අනතුරුව 1988 ජනවාරි මස 02 දින දෙවන ලුතිතන් වරයෙක් වශයෙන් අධිකාරියට පත්ව 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඇතුලත්ව රාජකාරී සිදු කර ඇත. පසුව 6 ශ්‍රීලපාහ ඒකකයේ විවිධ තනතුරු හොඹවා හත්වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අටවන දෙවන අණදෙන නිලධාරි වශයෙන් 2002 ඔක්තෝබර් මස 15 වන දින සිට 2003 පෙබරවාරි මස 11 දින දක්වා රාජකාරි කර ඇත. පළවන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ තිස්හත්වන දෙවන අණදෙන නිලධාරි ලෙසින් 2005 මාර්තු මස 01 දින සිට 2006 ජනවාරි මස 04 දින දක්වා රාජකාරි ඉටුකර ඇත.

දශක තුනක් පුරා කුරිරු යුද්ධයේ මානුෂිය මෙහෙවරේදී 2007 පෙබරවාරි 12 දින සිට 2008 දෙසැම්බර් මස 12 දින දක්වා හතරවන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ලෙසින් රාජකාරි කරමින් අවසන් මානුෂිය මෙහෙයුමේදී තම හට පිරිස් වෙත ඇවසි උපදෙස් හා නායකත්වය ලබාදී ඇත. එපමනක් නොව බළසේනාවන් හී රාජකාරී ඉටු කරමින් ද්‍රවිඩ ජනතාව නැවත පදිංචි කිරීමට ප්‍රමුබත්වයක් ගෙන කටයුතු කර තිබේ.

රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රථම ප්‍රධාන මාණ්ඩලික නිලධාරි ලෙසින් කටයුතු සිදු කර ඉන් අනතරුව රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විසි දෙවන සේනාවිධායක ලෙසින් රාජකාරී ඉටු කරනු ලබයි.

රෙජිමේන්තු අධිපතිතුමන් ඇතුලු සියලුම නිලයින් විසින් ඔබ හට නව තනතුරේ සුබ පැතුම් එක් කරන්නෙමු.













ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ වසර හතරකට අධික කාලයක් තුළ සභාපතීත්වය දරමින් ඉමහත් සේවයක් ඉටු කළ දමයන්ති රත්නායක මැතිනිය යුද හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනිය වශයෙන් පත්විය. ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවෙන් ගරු සභාපතිනිය සමුගැනිම නිමිති කර ගෙන විශේෂ සමුගැනිමේ උත්සවයක් 2013.08.15 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවස්නයේ දී පැවැත් විය.



ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ධනංජනී කරුණාසේකර මැතිනිය 2013.08.15 වන දින වැඩ භාර ගන්නා ලද අතර, ශ්‍රීලපාහ සේවාවනීතා ශාඛාවේ සාමාජිකා දනූෂා වීරසූරිය මහත්මිය ගරු ලේකම්තුමිය වශයෙන් පත්විය.

# මියගිය රණවිරුවෙකුගේ ළඟම ඥාතීන්ට හිසට සෙවනක්...



ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූල්‍ය පරිත්‍යාගයෙන් හා 17 (සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් වැලිකන්ද අසේලපුර ප්‍රදේශයේදී 2013.07.06 වන දින 6 ශ්‍රීලපාහ ඒකය සමගින් රාජකාරි කරමින් සිටියදී මියගිය සෙ/14748 ලාකෝ අනුර ශාන්ත කේජී රණවිරුවාගේ දූ දරුවන් වෙත ඉදි කරන ලද නව නිවස එවකට යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩි රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමන්ගේ හා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනියගේ සුරතින් විවෘත කර පරිත්‍යාග කරන ලදී.

# රණවිරුවෙකුගේ රෝගාතුර දියණියට වෛද්‍යාධාර...

සේවා වනිතා විත්ති



ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව වෙතින් 5 (සේවා) ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/5ඩී01572 සාසෙ සුගත්බංඩාර බීජ් රණවිරුවාගේ අසනීප තත්ත්වයෙන් පසුවන දියණියට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා ගරු සභාපතිනි ධනංජනී කරුණාසේකර මැතිනියගේ සුරතින් රු. 50000.00 ක මුදලක් 2013.09.08 දින පරිත්‍යාග කරන ලදී.

# අබාධිත රණවිරුවෙකුට හිසට සෙවනක්...

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූල්‍ය පරිත්‍යාගයෙන් හා රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් මාවනැල්ල ප්‍රදේශයේදී 2013.07.09 වන දින රෙජිමූඛ ශ්‍රීලපාහ ඒකකයේ ආබාධිත රණවිරුවෙක් වන සෙ/314377 කෝප්‍රල් රූපසිංහ අයිජීඑන් වෙත ඉදි කරන ලද නව නිවස එවකට යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩි රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමන්ගේ හා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිනි දමයන්ති රත්නායක මැතිනියගේ සුරතින් විවෘත කර පරිත්‍යාග කරන ලදී.







# විශේෂ සමරු කලාපයක් එළි දැක්වීම






ශ්‍රී ලංකා පාබල හමුදාවෙන් බිහි වූ සවැනි යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී පිළිබඳ විශේෂ වයිට් හැකල් සඟරාවක් මුද්‍රණය කර එම සඟරාව පිළිගැන්වීමේ උත්සවය යුද හමුදා මූලස්ථානයේදී 2013 සැප්තැම්බර් මස 21 වන දින සිදු කරන ලදී.

ශ්‍රී ලංකා යුද හමුදාවේ විසිවන යුද්ධ හමුදාධිපති තුමා වෙත මෙම විශේෂ සඟරාව පිළිගැන්වන ලැබුවේ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසිනි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් එදා මෙදා තුර යුද්ධ හමුදාධිපති වරු විසිදෙනෙකු බිහිවී ඇතත්, තම රෙජිමේන්තුවෙන් චරිතාප්‍රදානය පිළිබඳව සඟරාවක් ප්‍රථම වතාවට මුද්‍රණය කර බෙදාහරිනු ලැබුවේ ශ්‍රී ලංකා යුද හමුදාවේ මහ ගෙදර වන ශ්‍රී ලංකා පාබල හමුදාවෙනි.

# සෙසුනිල මුලුතැන්ගේ සහ භෝජනාගාරය ඉදිකිරීම





ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ සෙසුනිල භෝජනාගාරය සහ මුලුතැන්ගේ නවීකරණය කිරීම සඳහා ඉදි කිරීම් කටයුතු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 2013 සැප්තැම්බර් මස 16 වන දින සුබ මොහොතින් සිදු කරන ලදී. මංගල පස් පිඩැල්ල ලුතිතන් කර්නල් ඒඑස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ විසින් සිදු කළ අතර, රෙජිමේන්තු අධිපති විසින් මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනාවන් මධ්‍යයේ මුල්ගල තබන ලදී.

# 2(සෙව්) ශ්‍රීලපාහ පුවත්



පරිත්‍යාගය ලබාදුන් අයවලුන්

| | | | |
|---|---|---|---|
| සෙ/2ඩී01376 | ව/සැර | දසනායක | ඒසීඑස් |
| සෙ/2ඩී02334 | සැරයන් | රංජිත් | එල්බී |
| සෙ/2ඩී02120 | සැරයන් | උඩවෙල | වීජීඑන් |
| සෙ/2ඩී01918 | කෝප්‍රල් | ප්‍රියන්ත | ටීඑච්එස් |
| සෙ/2ඩී03189 | කෝප්‍රල් | ජයන්ත කුමාර | අර්ඩීඑම් |
| සෙ/2ඩී03039 | ලාකෝ | ජයතිස්ස බණ්ඩාර | ඩීඑම් |
| සෙ/2ඩී03237 | ලාකෝ | ජයන්ත වීරසිංහ | පීඑම් |

හයිටි රාජ්‍යයේ සාමසාධක රාජකාරීන් සඳහා සහභාගි වී සිට නැවත මෙරටට පැමිණ ඒකකයේ රාජකාරීන් හා නියැලීමට යෙදුන පහත නම් සඳහන් සාමාජිකයින් විසින් ඒකකයේ ප්‍රයෝජනය සඳහා සියලු උපාංග සහිතව පරිගණක යන්ත්‍ර 02 ක් ඒකක අණදෙන නිලධාරි වෙත 2013.06.15 දින මුලස්ථානය චුන්ඩිකුලම් හිදී පරිත්‍යාග කරන ලදී.

මෙම බළඇණියේ සාමාජිකයින් ගේ සුබසාධනය හා පාලන කටයුතු කාර්යක්ෂමව සිදු කර ගැනිම සඳහා ප්‍රයෝජනවත් වන මෙම පරිත්‍යාගය සිදු කළ එම ජ්‍යොකොනොනින්/කොනොනින් හට බළඇණියේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම දෙනා ස්තුතිය පුද කරන අතර ඔවුන්ගේ යුද හමුදා ජීවිතය මෙන්ම සිවිල් ජීවිතයද සාර්ථක වේවායි අප සැම පතන්නෙමු.

**බුද්ධි නිලධාරි - 2(සෙව්) ශ්‍රීලපාහ**

# 18(සෙව්) ශ්‍රීලපාහ පුවත්

## විශ්‍රාමික නිලධාරිගෙන් ඒකකයට අතහිත

මෙම ඒකකයට අයත් නි/7708 ලුතිතන් එච්පී බර්නාඩ් ශ්‍රීලපාහ යන නිලධාරි 2013.04.01 වන දින ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාවෙන් විශ්‍රාම යාම නිමිත්තෙන් ඒකකයේ පාලන කටයුතු සිදු කිරිමේදි අඩුපාඩුවක්ව පැවති පරිඝණක යන්ත්‍රයක් තත් නිලධාරිගේ ධන පරිත්‍යාගයෙන් 2013.04.01 වන දින ඒකක අණදෙන නිලධාරි මේජර් ඩබ්ලිව්ඒවයිකේ වීරසිංහ ශ්‍රීලපාහ වෙත පරිත්‍යාග කරන ලදී.






## පාඨමාලාවෙන් දක්ෂතා දැක් වූ දෙවන අණදෙන නිලධාරි

නිප්‍රපුම - බුත්තල හි පාඨමාලා අංක 02 යටතේ පවත් වන ලද කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව සඳහා සහභාගි වී තෙවනි ස්ථානය ලබාගෙන ශ්‍රී ලංකා ස්වේච්ඡා බළසේනාවටත්, රෙජිමේන්තුවටත්, ඒකකයටත් කීර්තියක් ගෙන දුන් 18(සෙව්) ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි නි/4880 මේජර් එච්එම්පීසී හේරත් ශ්‍රීලපාහ

**පරිඝණක අංශය - 18(සෙව්) ශ්‍රීලපාහ**

# 4 ශ්‍රීලපාහ පුවත්

## කාර්යාල සංකීර්ණය සහ ජල ව්‍යාපෘතිය විවෘත කිරීම

මුලතිව් ආරක්ෂක සේනා මූලස්ථාන බලප්‍රදේශයේ මුල්ලියාවේලි ස්ථානගත 4 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ නව බළඇණි කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය සහ ජල ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවය සඳහා ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් පීඩිජේසී ප්‍රේමතිලකගේ ආරාධනයෙන් 2013.07.14 දින සුබ මොහොතින් එවකට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී බළඇණි මූලස්ථාන කාර්යාල සංකීර්ණය, ජල ව්‍යාපෘතිය විවෘත කරන ලදී. මෙම විශේෂ අවස්ථාව සඳහා මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එල්බීආර් මාර්ක් ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඇතුලු පාබල හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහ ආරක්ෂක සේනා බල ප්‍රදේශයේ අනෙකුත් ඒකක වල ජ්‍යෙෂ්ඨ නිලධාරින් සමඟින් සෙසුනිලයින් සහභාගි විය.

මෙදින පැමිණි ප්‍රධාන ආරාධිත අමුත්තා වෙත



සම්මාන මුරයක් පිරිනැමීමෙන් අනතුරුව මගුල් බෙර වාදන සහ නැට්ටුවන් පෙරටුකර ගනිමින් විවෘත කිරීමට නියමිත කාර්යාල සංකීර්ණය සඳහා කැඳවාගෙන යන ලදී. එම ස්ථානයේ ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් පිරිත් සජ්ඣායනාවන් මධ්‍යයේ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ රෙජිමේන්තු අධිපති විසින් පීත්ත පටිය කැපීමෙන් විවෘත කිරීම සනිටුහන් කරන ලදී. එම ගොඩනැගිල්ලේ පිවිසුම් ස්ථානයේ කිරි ඉතිරවීමෙන් පසු සකස්කර තිබූ මෙම ගොඩනැගිලි ඉඳි කිරීම් සිදු කළ ආකාරය ඉදිරිපත් කිරීමක් සඳහා ද සහභාගී වන ලදී.

මෙම විශේෂ උත්සවයේදී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ රෙජිමේන්තු අධිපති අණදෙන නිලධාරි කාර්යාලයේදී පොල් තෙල් පහන දල්වා විශේෂ අමුත්තන්ගේ සටහන් පොතෙහි මෙම අවස්ථාව පිළිබඳව සටහන් කිරීමෙන් පසු අවස්ථාවට සහභාගී වී සිටි පාබල හමුදාවේ නිලධාරින් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටින ලදී.



ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ දෙවන ජ්‍යෙෂ්ඨතම බළඇණිය 4 වන ශ්‍රී ලංකා පාබල හමුදාව වන අතර, වසර 25 කට වඩා පැරණි ඉතිහාසයක් ඇති මෙම ඒකකයට අයත් නිලධාරින් හා සෙසුනිලයන්ගේ පානීය ජල අවශ්‍යතාවයට ප්‍රයෝජනයට ගැනීම සඳහා නිලධාරින් හා සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ළිඳක් කැපීම, ආරක්ෂිත අයුරින් ළිඳ බැඳීම, කඳවුරටම ජලය ලබාගැනීමට ඇවසි ජල නල පද්ධතියක් ද ඉදිකරන ලදී. මෙම ව්‍යාපෘතිය ආරාධිත අමුත්තා විසින් කඳවුරේ පානීය ජල ව්‍යාපෘතිය විවෘත කරන ලදී.



මෙම ඒකක බළඇණි මූලස්ථාන කාර්යාල සංකීර්ණය ඉඳි කිරීම සඳහා මුල්ගල තැබීම 2012.11.17 වන දින මෙම ඒකක අණදෙන නිලධාරි විසින් සිදු කළේය. එහි ඇස්තමේන්තු ගත මුදල රුපියල් ලක්ෂ 85 ක් විය. එතැන් පටන් බළඇණි මූලස්ථාන කාර්යාල සංකීර්ණයේ ඉඳි කිරීම් ඒකක අණදෙන නිලධාරිගේ මඟ පෙන්වීම හා ඒකකයේම භටපිරිස්වල ශ්‍රම දායකත්වයෙන් සිදු කරන ලදී. මෙම ඉඳි කිරීම් සිදු කරන කාලය තුළදීම බළඇණි මූලස්ථානයට පිවිසෙන ප්‍රධාන දොරටුව, මුරහල, බළඇණි මූලස්ථාන කඳවුර ස්ථිර යුද්ධ හමුදා කඳවුරකට අනුරූප වන අයුරින් ඉඳි කිරීමට හැකි විය.


මෙම ඒකකයේ නිලධාරි හා සෙසුනිලයින් ඇතුලු පාබල හමුදාවේ මේ සඳහා සාහභාගී වූ සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරින් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි හා රෙජිමේන්තු අධිපති විසින් යුද්ධ හමුදා රාජකාරි පිළිබඳව දැනුවත් කිරීම් සහ විනය සම්බන්ධව කරුණු රාශියක් ඉදිරිපත් කරමින් දැනුවත් කරන ලදී.



බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ

# 5 (සෙව්) ශ්‍රීලපාහ පුවත්

## බළඇණි සාමූහික පුහුණුවීම්



5 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය අච්චුවේලි ප්‍රදේශයේ ස්ථානගතව සිටින අතරතුර 2013.04.18 දින සිට 2013.05.26 දින දක්වා 55 සේනාංකය යටතේ ඇති 553 බලසේනා බළඇණි පුහුණු පාසල - පරියපච්චපලෙයි හිදී බළඇණි සාමුහික පුහුණුවීම් සිදු කරන ලදී.

511 බලසේනාධිපති කර්නල් ඒජීඅයි ප්‍රනාන්දු යූඑස්පී විසින් ආරම්භක දේශනය පැවැත් වූ අතර, පාඨමාලාව සඳහා නිලධාරීන් හත් දෙනෙකු සහ සෙසුනිලයින් දෙසිය හතලිස් හතර දෙනෙකු සහභාගි වූහ. පාඨමාලාව ඉතාමත් උද්‍යෝගිමත් ලෙස හැදැරූ 5 ශ්‍රීලපාහ ඒකකයේ හටපිරිස් විවිධ උපක්‍රම අභ්‍යන්ත ආරක්ෂක රාජකාරි, ජීව වෙඩි තැබීම්, අවි පුහුණුව, සිතියම් කියවීම, ප්‍රති විප්ලවකාරි ක්‍රියාන්විත ආදී පුහුණුවීම් ඉතාමත් කැපවීමෙන් යුතුව සිදු කරන ලද්දේ ඒකාකාරි රාජකාරි කටයුතු වලින් මිදී ලද අවස්ථාවන් උපරිම ප්‍රයෝජනයට ගනිමින්ය. තවද බළඇණි පුහුණු පාසල මඟින් පවත්වන ලද ආරාධිත දේශනය යටතේ පාලන, භකාස, මනෝ විද්‍යාත්මක බුද්ධි කටයුතු, මානසික ආතතිය, අන්තර් ජාතික මනුෂ්‍යවාදී නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි පිළිබඳ දේශන ඔවුන්ට මහත් පිටුවහලක් විය. ඒකක අණදෙන නිලධාරි විසින් පැවැත් වූ ප්‍රගුණ වෙඩික්කරු දේශනය සහ අනෙකුත් දේශනයන්ද ඔවුන් හට මහත් පිටුවහලක් විය.

5 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේඑල් කිත්සිරි ශ්‍රීලපාහ ගෙන් ලැබුණු නිවැරදි මඟ පෙන්වීමත් දිරි ගැන්වීමත් මත බළඇණි පුහුණුවීම් සාර්ථක කර ගැනිමට අප හටපිරිස් හට හැකි විය. සමස්ත බළඇණි පුහුණුවීම් අවසානයේ හොඳම කණ්ඩායම ලෙස 'ඩී' කණ්ඩායම ද, සැම අතින්ම අති ශූර ශිෂ්‍යා සහ දක්ෂතම වෙඩික්කරු ලෙස නි/8524 ලුතිතන් බීඑල්ටී ගයාන් ශ්‍රීලපාහ ද, හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් යුත් සෙබළා ලෙස සෙ/5ඩී03118 සාසෙ සැම්සන් පීඑම් ද, දක්ෂතම පෙළ අණ දෙන්නා ලෙස සෙ/5ඩී01449 කෝප්‍රල් ප්‍රියන්ත ප්‍රනාන්දු ආර්ජ්ආර් ද, දක්ෂතම බණ්ඩ භාර සැරයන් ලෙස සෙ/5ඩී01464 සැරයන් ලොකුබණ්ඩා ආර්ජ් ද, 'ආධාරක' කණ්ඩායමේ හොඳම සෙබළා ලෙස සෙ/5ඩී02449 කෝප්‍රල් රාජපක්ෂ ආර්ජ් යන අයවලුන් දක්ෂතා දක්වමින් කුසලාන හිමි කර ගන්නා ලදී. අප බළඇණියේ දක්ෂතා අගය කිරීම සඳහා අවසාන දේශනයට පැමිණි 51 සේනාංකාධිපති වන බ්‍රිගේඩියර් ඩීඑම්ඩීසීඩී ගුණවර්ධන විසින් මහත් පැසසුමට ලක් කරමින් ජයග්‍රහණ කුසලාන ප්‍රදානය කරන ලදී. පසුව බළඇණිය නැවත අච්චුවේලි ප්‍රදේශයේ රාජකාරි සඳහා 201306.24 පැමිණෙන ලදී.

**බුද්ධි අංශය 5 (සෙව්) ශ්‍රීලපාහ**











# 6 ශ්‍රීලපාහ පුවත්

## 23 වන බළඇණි දින සංවත්සරය

වර්ෂ 1990.06.08 දින පෙරවරු 0810 පැයට යෙදුනු සුබ මොහොතින් පාබල හමුදා වංශකථාවට නවතමයෙන් එක් විය. 6 ශ්‍රීලපාහට 23 වසරක් සපිරෙන මොහොතේදී අභිමානවත් වූ නව වසරකට පියමන් කරනුයේ ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේජ් පුෂ්පකුමාර ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහගේ නායකත්වයෙන් හා නිලධාරි සෙසුනිලයින් ඒකක ඉතිහාසයට නව පිටුවක් පෙරලා තබමිනි.

මෙම බළඇණිය ආරම්භයේ සිට මේ දක්වා නායකත්වය දුන් අණදෙන නිලධාරින් පසුගිය කාලවකවානුව තුළ පැවති යුදමය තත්ත්වයට නායකත්වය ලබා දෙමින් ඇවැසි උපදෙස් හා අණ දී ඒකකය ජයග්‍රාහී ගමන් මගක් දක්වා රැගෙන එන්නට දිරිය ශක්තිය දුන් සෙන්පතියන් සිහිපත් කරනුයේ හදපිරි සතුටිනි. එපමණක්ද නොව මේ දක්වා රාජකාරි කර ඇති සියලුම අයවලුන්ද



ඒකකයට ශක්තියක් විය. එමෙන්ම සිවිල් සේවක මහත්වරුන්ද අභිමානවත් ලෙස තම රාජකාන් ඉටුකරමින් ජයග්‍රාහි මාවතක් වෙත එන්නට අවශ්‍ය ජවය ශක්තිය තම ශක්ති ප්‍රමාණයෙන් ලබාදුන් බව මෙහිදී සඳහන් කළ යුතුමය.

මෙම ඒකකය පුරා වසර 23 ක් මුළුල්ලේ ස්වකීය දේශයේ නිදහස් නිවහල් බවින් යුතු ශ්‍රී ලංකාවක් ගොඩනැන්වීමෙහිලා ඉටු කරන ලද මෙහෙවරයේදී ඒකකයට අයත් නිලධාරින් 17 ක්ද, සෙසුනිලයින් 443 ක්ද, වීරෝධාර රණවිරුවන් ලෙස දැයෙන් සමුගත් අතර, උපන් දේශය ජය බිමක් බවට පත් කිරීමට තම ජීවිතදානයෙන් සටන්කළ විරුවන්ට නිවන් සුව අත් වේවායි! අප සැම ප්‍රාර්ථනා කරන්නෙමු. ඒකකය සමඟින් රාජකාරී කරමින් සිටියදී ත්‍රස්තවාදීන්ගේ ම්ලේච්ඡ ප්‍රහාර හේතුවෙන් තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව සිටින සියලුම විරුවන් සිහිපත් කරන මේ මොහොතේ ඔවුන් සියලු දෙනාට ඉක්මන් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

ප්‍රදේශයන් කිහිපයක විවිධ රාජකාරින් වල නිරතව සිටින ඒකක හටපිරිස් සඳහා විවිධ අන්දමේ අංගයන්ගෙන් සමන්විත වන අයුරින් බළඇණි දිනය සැමරීමට අණදෙන නිලධාරිගේ උපදෙස් හා මගපෙන්වීම යටතේ කටයුතු සම්පාදනය විය. එය අධියර දෙකක් වශයෙන් දින දෙකක් තුළ සිදු කළේය. බළඇණි සංවත්සරය සැමරීමට ඒකක හටපිරිස් රාජකාරි වලින් මුදවා ගැනීමට අණදෙන නිලධාරි විසින් කටයුතු කළේය. ඒ අනුව 2013.06.08 දින මන්නාරම් ප්‍රදේශයේ දී උත්සව මාලාවක් සහ 2013.06.09 වන දින මිහින්තලේ මහකනදරාව කඳවුරේදී උත්සව මාලාවක් සංවිධානය කරන ලදී. මේ සඳහා ඒකක දෙවන





අණදෙන නිලධාරි මේජර් ඒඑන් ද සිල්වා ශ්‍රීලපාහ ගේ මග පෙන්වීම යටතේ 2013.06.08 දින මන්නාරම් සවුත්බර් ප්‍රදේශයේදී සම්මාන මුරයකින් උත්තමාචාරය පිරිනමා ඒකක අණදෙන නිලධාරි පිළිගන්නා ලදී. ඉන් අනතුරුව 'ඒ' සහ 'බී' කණ්ඩායම් හටපිරිස් විසින් සූදානම් කර තිබූ තේ පැන් සංග්‍රහය ද, භුක්ති විදින ලදී.

පේසාලේ මුහුදු තීරයේදී ඒකකයට උදා වූ 23 වන උපන් දිනය වෙනුවෙන් කණ්ඩායම් දෙකෙහිම හටපිරිස් අමතා දේශණයක් අණදෙන නිලධාරි විසින් පවත්වන ලදී. ඉන් පසුව හටපිරිස් හී සුහදත්වය වර්ධනය කිරීම සඳහා වොලිබෝල් තරඟයක් පවත්වන ලදී. තරඟයේ නිමාවෙන් පසු අවසානයේ විවිධ වු ආහාර වර්ගයන්ගෙන් සමන්විතව පිළියෙල කර තිබු දිවා ආහාර සියලුම දෙනාම භුක්ති විදින ලදී. එදින 1700 පැයට පමණ බළඇණි උපන් දින සාදය මන්නාරම් ප්‍රදේශයේදි අවසන් විය.

පසු දින ඒකක අණදෙන නිලධාරි මිහින්තලය මහකනදරාව යුද හමුදා කඳවුරේදී පාලන කණ්ඩායමවෙතින් කඳවුරු සම්මාන මුරයක් පිරිනමන ලදී. ආචාරශිලිව එතුමන්



පිළිගැනිමෙන් පසු කඳවුරු භූමියේ බළඇණි දිනය සිහිවීම වස් අඹ පැලයක් රෝපනය කළේය. ඒකක හටපිරිස් 37 දෙනෙකු ඊළඟ නිලයට උසස් කිරීම සඳහා නිල ලාංඡන පලදවන ලදී. එම කටයුතු නිමාවෙන් පසු අණදෙන නිලධාරි රණවිරු ස්මාරක ශාලාවේදී හටපිරිස් අමතා සූදානම් කර තිබූ තේ පැන් සංග්‍රහයකට පැමිණි සිටි සියලු දෙනා සහභාගි විය.

එදින ඒකක නියමුවාගේ සංකල්පයකට අනුව සංගිත සාදයක් පැවැත් විය. ඒකක සංගිත කණ්ඩායම වන " **හැකල්ස්** " සංගිත කණ්ඩායම වෙතින් මුදාහල සංගීත නාද රටාවන්ට අනුව හටපිරිස් නර්තනයේද යෙදුනි. පසුව දිවා ආහාරය ගැනිමෙන් පසු බළඇණි දින සැමරුම් උත්සවයේ කටයුතු නිමාවට පත් විය. බළඇණි දිනය සැමරිම සඳහා දින දෙකටම සහභාගි කරවා ගැනිමට නොහැකි වූ අයවළුන් වෙත එම ස්ථාන වෙත ගොස් ඔවුන් අමතා ඔවුන් හට කැවිලි පෙවිලි හා දිවා ආහාරය ලබාදීමද, සිදු කරන ලදී. ඒකකය වෙනුවෙන් අනූපමේය මෙහෙයක් සිදු කරන සිවිල් සේවක මහත්වරුන් එක් ස්ථානයක් වෙත කැඳවා 2013.06.10 දින දිවා සංගිත සාදයක් සහිතව විනෝද වන්නට අවස්ථාව සලසාදී අවසානයේ දිවා ආහාරය භුක්ති විදීමෙන් පසු බළඇණි දින සැමරුම නිමාවට පත් විය.

**බුද්ධි අංශය - 6 ශ්‍රීලපාහ**

# 7 ශ්‍රීලපාහ පුවත්

## නව අණදෙන නිලධාරී

වර්ෂ 1992 ක්වූ ඉල් මස විසිවනදා සුබ මොහොතින් යාපා පටුන ආසන්නයේ සුන්දර මණ්ඩතිව් දූපතේ ස්ථාපනය කරන ලද හත්වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට 2013 ක් වූ අගෝස්තු මස 23 දිනය තවත් සුවිශේෂී දිනයකි. ඉතිහාසයට එක්වූයේ දසවන නියමුවාණන්ගේ සම්ප්‍රාප්තිය සිදුවීමයි. යෙදී තිබූ සුබ මොහොතින් නි/63017 ලුතිතන් කර්නල් එම්පීඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ සියලු නිලයින්ගේ සුබ පැතුම් සමඟින් සිය තනතුරේ රාජකාරි ආරම්භ කළේය.





ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ නිත්‍ය බළඇණියක් වශයෙන් මේ වන විට දශක දෙකකට වැඩි කාලයක් අණදෙන නිලධාරින් අට දෙනෙකුගේ සහ එක් වැඩ බලන අණදෙන නිලධාරිගේ මඟ පෙන්වීම යටතේ පරිනත විය. දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත් හී ක්‍රියාන්විත රාජකාරි මෙන්ම බස්නාහිර පළාතේ ද රාජකාරින් හි නිරත වූ මෙම බළඇණිය වර්තමාණයේ 57 සේනාංකයට අනුයුක්තව 571 බළසේනාව යටතේ කිලිනොච්චි නගරය කේන්ද්‍ර කරගනිමින් ස්ථානගතව සිටී.

ඒකකයේ අටවන අණදෙන නිලධාරි ඒකකයෙන් නික්ම යෑමත් සමග වැඩ බලන අණදෙන නිලධාරි ලෙස ඒකකයේ දෙවන අණදෙන නිලධාරි තනතුර දැරූ නි/63049 මේජර් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ පත් විය.

දසවන අණදෙන නිලධාරි වෙත තම සිය තනතුරේ රාජකාරි භාර ගැනීමට පැමිණි දින වැඩ බලන අණදෙන නිලධාරිගේ මඟ පෙන්වීම යටතේ 2013 අගෝස්තු මස 23 දින වැඩසටහන් කටයුතු සූදානම් විය. නව නියමුවානණ් ප්‍රධාන දොරටුව වෙත සපැමිණීමෙන් පසු වැඩ බලන අණදෙන නිලධාරි විසින් නව අණදෙන නිලධාරි පිළිගන්නා ලදී. ඉන් අනතුරුව කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීමෙන් පසු චිරාත්ගත සම්ප්‍රදානුකූලව පොල්තෙල් පහන දල්වා මහා සංඝ රත්නයේ ආශිර්වාදය හා පිරිත් සජ්ඣායනා මධ්‍යයේ දසවන අණදෙන නිලධාරි ලෙස ඒකකයේ වැඩ භාරගන්නා ලදී.



එම කාර්යය නිමාවෙන් පසු නව අණදෙන නිලධාරි ඒකකයේ සියලුම භටපිරිස් ඇමතීමටද කටයුතු කළේය. එහිදී ඒකකය සමඟින් රාජකාරි කරමින් සිටියදී මියගිය හා අතුරුදහන් වූ සියලු දෙනා හට නිවන් සුව ප්‍රාර්ථනා කරන බවත්, තුවාල ලැබ දැනට ආබාධිත තත්ත්වයට පත් සියම දෙනා හට ඉක්මන් සුවය හා සෙත් ප්‍රාර්ථානා කරන ලදී. තමා විසින් හදාරන ලද දේශිය හා විදේශිය පාඨමාලා වලින් හා යුද්ධ හමුදා සේවා කාලය තුළ ලද අත්දැකීම් වලින් ලද පන්නරය සමඟින් ඒකකයේ උන්නතිය සඳහා තම උපරිම දායකත්වය ලබාදීමට ක්‍රියා කරන බවත්, ඒ සඳහා සියලුම අයවලුන්ගේ සහයෝගය බලාපොරොත්තු වන බවත් සඳහන් කරන ලදී. පසුව සියලුම නිලයින් විසින් සුදාන කර තිබූ තේ පැන් සංග්‍රහය බුක්ති විදින ලදී.

තම යුද්ධ හමුදා සේවා කාලය තුළදී රණ වික්‍රම හා රණ ශූර යන පදක්කම් වලින් පිදුම්ලත් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි හට මෙතෙක් ආ ගමනේදී ලද සුවිශේෂී පන්නරය තුළින් හා ''සේවය කරමි'' යන උද්ධෘත පාඨය පෙර දැරිව ඒකකයේ ඉදිරි රාජකාරි ඉටු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි යන්න දෙවන අණදෙන නිලධාරි ඇතුලු සියලු නිලයන් විසින් ප්‍රාර්ථනා කරන්නේමු.

**බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ**

## ආදරය

සිහිනයක් සේ දැනුන
මන්දාරම් අතීතය
රිදී ඉර දිදුලන්න දුරයි
තව කල් බොහෝම
වැහි බරව අහස් කුස
හඩ නගන යුරු සේම
හිතත් මගේ ඉරිතලා
හ ඬවලා ගිය නුඹට
ආදරේ මල් කෙවනි
ඇස් ළඟ තියා මම
දෑත් දිගු කරමින් බලා ඉදිමි
නුඹ එන තුරා

සෙ/320938 ලාකෝ රාජපක්ෂ ආර්එම්ඩී
සී කණ්ඩායම 7 ශ්‍රීලපාහ

# 8 ශ්‍රීලපාහ පුවත්

## සේවා මුක්ත හට සංගමේ කටාන ප්‍රවීණ රණවිරු නිවාසයේ 8 ශ්‍රීලපාහ සංචාර



ශ්‍රී ලංකා මාතාවගේ ස්වෛරීභාවය වෙනුවෙන් තම යොවුන් ජීවිතය කැපකොට වයෝවෘද්ධ විශ්‍රාමික සේවා මුක්ත හට සංගම් ප්‍රවීණ රණවිරු නිවාසය කටාන නේවාසිකව සිටින රණවිරුවන් උදෙසා 2013.07.04 දින ආහාර පාන ලබාදීම මෙම ඒකකය වෙතින් සිදුකරන්නට යෙදුණි.

ඒකකය වෙත පැවරෙන රාජකාරි මධ්‍යයේ වුවද මෙවන් ස්ථානය වෙත ගොස් ඒකක අණදෙන නිලධාරි, උපකරණ පාලන නිලධාරි, රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු හටපිරිස් සහභාගිත්වයද ඒකක කැලිප්සෝ සංගීත කණ්ඩායමෙහි සහභාගිත්වයද එම අවස්ථාව සඳහා ලබාදීමට කටයුතු සිදු කරන ලදී.



ඔවුන් වෙත පැනනැගී ඇති ප්‍රශ්න සබැදිවද මෙහිදී ඔවුන් විසින් අණදෙන නිලධාරි වෙත දන්වා සිටින ලද අතර, ඒ සඳහා පිළියම් ලබාදීමට හැකි පමණින් උදව් උපකාර ලබාදෙන මෙන් ඉල්ලීමක්ද ඔවුන් විසින් කරන ලදී.

ඒකක කැලිප්සෝ කණ්ඩායම් ගී රාවය මඟින් මොහොතකට හෝ ඔවුන්ගේ අතීතය සිහිපත් කර ඔවුන් සතුටු කිරීමට ලැබීම ඒකකයක් වශයෙන් අපි ලද භාග්‍යක් කොට සලකන්නෙමු.





බුද්ධි අංශය - 8 ශ්‍රීලපාහ

# මොඩර්න් වර්ල්ඩ්

අම්මා මම් පියතුම ඇගේ ඩැඩි වෙති
අක්කා අක්කි නංගි ඇගෙ බබී වෙති
කොම්පියුටරය සීඩී නෑ සියෝ වෙති
බොරු සුරුකුම් වල්පල් වල නිමක් නැති

සෙල් දුරකථනයෙන් රටටම මහ කතා ඇතී
මැගසින් පිල්ම් සිංදුව ගැන කතා වෙතී
ෂාරුක් රිතික් නිතරම පෙම්වතුන් වෙතී
එස්එම්එස් එම්එම්එස් නිමක් නැතී

පීසා කමින් කොක් එක මුවෙ හලා ගනී
අඩි උස පාවහන් ඇගෙ පා බඳා ගනි
ඇස් කන්නාඩි ඈ හිස තුල රඳා ගනි
පුළුවන් තරම් තොල් සායම් උලා ගනී

ස්කිනියකුයි ඇද සිටියේ උඩු කයට
යටිකය වැසී තිබුනේ ඇගෙ යන්තමට
කොණ්ඩය පාට පාටින් දිලිසුනි යසට
මේවා දකින නරලොව හොල්මන් අපට

**කෝප්‍රල් ජයරත්න ඩීඑන්**
**අණ සහ පාලන කණ්ඩායම**
**18(සෙව්)ශ්‍රීලපාහ**

THE WHITE HACKLE

# 10 ශ්‍රීලපාහ පුවත්

## අභිනවයෙන් ඉදි කළ නිලධාරි නිවස්නය





ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 10 වන සාමාජිකයා ලෙස වර්ෂ 1994 දුරුතු මහේ 23 රිවි දින නවක සාමාජිකයා ලෙසින් එක්වී විසිවන වසරට පාතබන මොහොතේ ඒකකය විවිධ ක්‍රියාන්විත ප්‍රදේශයන් තුළ රාජකාරි කිරීම හේතුවෙන් ඒකකය වෙත ස්ථිර නිලධාරි නිවස්නයක් ඉදි කිරීමට නොහැකි වීම මහත් අඩු පාඩුවක්ව පැවැතුනි. එවන් අවස්ථාවක ඒකක අණදෙන නිලධාරි වන ලුතිතන් කර්නල් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මග පෙන්වීම යටතේ දෙවන අණදෙන නිලධාරි මේජර් එච්එම්එන්බී ගුණරත්න ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහගේ සැලැස්මකට අනුව නිලධාරි නිවස්නය නවතමයෙන් පාලිනගර් යුද හමුදා කඳවුරේ ඉදි කිරීම ආරම්භ කරන ලදී.

ඒ අනුව ඒකකයේ සියලුම නිලධාරින්ගේ දායකත්වයෙන් සහ සියලුම සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් නව නිලධාරි නිවස්නයේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඉතාමත් කෙටි කාලයක් තුළ අවසන් කිරීමට හැකි විය. මෙම කැප කිරීම් වල ප්‍රතිඵලයක් වශයෙන් 2013 සැප්තැම්බර් මස 19 දින පෙරවරු 06.18 පැයට යෙදුන සුබ මොහොතින් අණදෙන නිලධාරි ගේ ප්‍රධානත්වයෙන් හා ඒකකයේ සියලුම නිලධාරින්ගේ සහභාගිත්වයෙන් විවෘත කරන ලදී

අසේමු කිළිනොච්චි බළ ප්‍රදේශය තුළ පිහිටි මෙම ඒකකයේ අංග සම්පූර්ණ පහසුකම් සහිත නිලධාරි නිවස්නය සහ සියලුම පහසුකම් සහිත නිලධාරි නිවස්න මුල්තැන්ගෙයකින් ද සමන්විතව ඉදිකර ඇත. මෙම මුලුතැන්ගේ විවෘත කිරීමද සිදු කිරීම මෙදිනම සිදු කරන ලදී.

මෙම සියලු කටයුතු ආරම්භයේදී මෙන්ම නිලධාරින්ගේ අයිතියට පත්වන මොහොතේද ආගමික වාතවත් වලට මුල් තැන දෙමින් කටයුතු කරන ලදී.






බුද්ධි අංශය 10 ශ්‍රීලපාහ


## *Robin Van Persie has been slaughtered in his homeland after Holland’s disastrous exit from Euro 2012*

Pundits and fans have accused him of being a poor finisher,arrogant and breaking team rules by making phone calls after the Holland matches on the pitch and going to kiss his wife in the stands. The Dutch football public want Van Persie dropped and Klaas-Jan Huntelaar selected as Holland’s main striker. Now Arsenal boss ArseneWenger has come out to vehemently defend his captain. Wenger said: “Robin van Persie deserves more credit in Holland than he gets. I think he was still the best striker at the European Championships.



# 26 ශ්‍රීලපාහ පුවත්

## වාර්ෂික යුද ශාරීරික යෝග්‍යතාසහ වෙඩි තැබීම් පරීක්ෂණය





පෙරියමඩු ස්ථාපිත ඒකකය සාමකාමී වාතාවරණයක පාබල හමුදා කාර්ය අවබෝධකර පුහුණුවට ප්‍රමුඛත්වයක් දෙමින් රාජකාරියේ නියලී සිටින ඊට සමගාමීව සිවිල් යුද හමුදා කටයුතු සම්බන්ධීකරණ රාජකාරිහි නිරතවන අතර, පැවරෙන රාජකාරීයන්ට අමතරව ඒකක සියලුම අයවලුන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා වෙඩි තැබීම් පරීක්ෂනයක් සිදු කරන ලදී. ඒකක අණදෙන නිලධාරි ගේ මග පෙන්වීම හා උපදෙස් යටතේ මෙම සියලු කාර්යයන් සිදු විය.

## පූජා සත්කාර

2013.06.07 දින පාලම්පිඩ්ඩි ශ්‍රී මුත්තු අම්මාන් කෝවිලෙහි ඇති ළිද සුද්ද පවිත්‍ර කර ප්‍රදේශයේ සිවිල් ජනතාවට පානීය ජලය ලබාගැනීමට සුදුසු පරිදි සකසා දීමට ඒකකයේ හටපිරිස් සමත් විය.

**බුද්ධි අංශය - 26 ශ්‍රීලපාහ**

# 14 (සෙව්) ශ්‍රීලපාහ පුවත්

## වෙසක් කූඩු නිර්මාණයට ජයග්‍රහනයක්



මෙම ඒකකය යාපනය අර්ධද්වීපයේ සිටි කාලය තුළ 2011 හා 2012 වර්ෂයන් තුලදී 55 සේනාංක මුලස්ථානය වෙතින් ලද උපදෙස් අනුව යාපනය ප්‍රදේශයේ කල වෙසක් පහන් කූඩුව ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය අතර, පැවැත්වූ තරඟාවලියෙන් වර්ෂ දෙකෙහිදිම ප්‍රථම ස්ථානය ලබා ගන්නා ලදි.

යාපනය ප්‍රදේශයෙන් ස්ථාන මාරුවීම් ලබා කොළඹ ප්‍රදේශයට පැමිණීමත් සමග යාපනය ප්‍රදේශයෙන් ලද ජයග්‍රහන හේතුවෙන් 2013 මැයි මස දියවන්නා වෙසක් කලාපයේ රෙජිමේන්තුව නියෝජනය කරමින් පහන් කූඩුවක් නිර්මාණය කිරීමට රෙජිමේන්තු අධිපති විසින් මෙම ඒකකය වෙත අවස්ථාව හිමිකර දෙන ලදී.

රෙජිමේන්තු වෙතින් ලද උපදෙස් අනුව ඒකක අණදෙන නිලධාරි මේජර් ඩීසීකේඩබ් රණසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ ගේ මග පෙන්වීම මත ඒකක නිලධාරි/සෙසුනිලයින්ගේ සහයෝගය ඇතිව නලපාන ජාතකය පිළිඹිබු කරමින් යාපනය චුන්ඩිකුලම් ප්‍රදේශයේ මුහුදු තිරයෙන් සොයා ගන්නා ලද සිප්පිකටු උපයෝගි කරගෙන සිප්පිකටු කූඩුව නමින් නිර්මාණශීලි ලෙස වෙසක් පහන් කූඩුවක් නිර්මාණය කර 2013 මැයි මස 24 දින සිට 29 වන දින දක්වා දියවන්නා වෙසක් කලාපයේ ජනතාව වෙත ප්‍රදර්ශණය කරන ලදී.

එම පහන් කූඩුවේ නිර්මාණශීලිත්වය නිසාම බොහෝ රූපවාහිනී නාලිකාවල සහ විශේෂ වැඩසටහන් වල නිතර නිතර ප්‍රදර්ශණය කළ අතර, මැති ඇමතිවරුන්ගේ ප්‍රභූවරුන්ගේ සහ මුළු මහත් ශ්‍රී ලංකාවාසි ජනතාවගේ ප්‍රසාදයට ලක්වී ඇති අතර, එම හේතුවෙන් තාරුණ්‍යට හෙටක් යන සංකල්පයට අනුව පොසොන් පොහොය මුල් කරගෙන අනුරාධපුර සඳගිරිසැය ඉදිරිපිට මෙම වෙසක් පහන්කූඩුව ප්‍රදර්ශණය කිරිමට අවස්ථාව උදාවූ අතර, එහිදීද මෙම පහන් කූඩුවු ජනතාව අතර මහත් ප්‍රසාදයට ලක්වී ඇත.

**බළඇණි කාර්යාලය - 14 (සෙව්) ශ්‍රීලපාහ**

THE WHITE HACKLE

# 11 ශ්‍රීලපාහ පුවත්

## ඒකකයට සුවිශේෂී මොහොතක්



**“සේවය කරමි”** යන ආදර්ශ පාඨය පෙරටුකර ගනමින් 11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය යටතේ 51 සේනාංකයට අනුයුක්තව 513 බළසේනා මූලස්ථානය යටතේ ස්ථාගතව රාජකාරි කරනු ලබයි. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ සංකල්පයට අනුව බළඇණි සඳහා ස්ථිර කඳවුරු ඉදිකිරීම සිදු කරනු ලබයි. ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහ යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම් හතුරුසිංහ ආර්එස්පී එන්ඩීසී අයිජී යන ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ නිරතුරු උපදෙස් හා මග පෙන්වීම අනුව ඒකක බළඇණි මූලස්ථාන කඳවුර කරෙයිනගර් දූපතේ ඉදි කළේය. මෙම ප්‍රදේශය මනරම් වෙරළ තීරයකින් පොහොසත් අතර, ඒ ආසන්නයේ මෙම කඳවුර ගොඩ නඟා ඇත.



මෙම ඒකක බළ ප්‍රදේශයේ සංචාරය කළ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් සුහදව පිළිගන්නා ලදී. සෙසුනිලයන් හට ගොඩනගා තිබූ පෙර නිමි ගොඩනැගිලි පරීක්ෂා කිරීමෙන් පසු කඳවුරෙ සියලුම ස්ථානයන් නිරීක්ෂනට භාජනය කළේය. තම සංචාරය නිමා කරමින් පිටව යන අවස්ථාවේදී කඳවුරු සංචාරය පිළිබඳ මතක සටහන් පොතෙහි මතක සටහන් තැබීමට අමතක නොකරන ලදී. මෙම අවස්ථාවට ආසේමු (යා) ආඥාපති මේජර් ජෙනරාල් එම් හතුරුසිංහ ආර්එස්පී එන්ඩීසී අයිජී හා 51 සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩීඑම්ඩීසීඩී ගුණවර්ධන සහභාගි වූහ.

ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ අප බළඇණි කඳවුරු සංචාරය ඒකකට මෙන්ම පාබල හමුදා රෙජිමේන්තුවටද ඉමහත් ගෞරවයක් වූ බැව් මෙසේ සනිටුහන් කරන්නෙමු. අප බළඇණියේ ඉදිරි අනාගත ගමන සාර්ථකව සිදු කරගෙන යාමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා යැයි එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය 11 ශ්‍රීලපාහ**





# ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී





1981 වසරේ කෙඩෙට් නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකා යුද හමුදාවට එක් වන මොහු දියතලාව යුද හමුදා විද්‍යා පීඨයෙන් ලද මූලික පුහුණුවීමෙන් අනතුරුව ශ්‍රී ලංකා පාබල හමුදාවට එක් වූයේ 1984 වසරේදීය.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ 4 වන බළඇණිය ආරම්භයත් සමඟින් එහි ප්‍රථම විධායක අධිකාරි ලෙසින් රාජකාරී කර ඉන් අනතුරුව කණ්ඩායම් නිලධාරි අණදෙන ලෙස රාජකාරී කර 1992ජුනි මස 27 දින සිට 1992 නොවැම්බර් මස 16 දින දක්වා පළමු බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ 25 වන දෙවන අණදෙන නිලධාරි ලෙසින් රාජකාරි ඉටුකර ඇත. 1992 නොවැම්බර් මස 20 වන දින නඟාසිට වූ හත්වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රථම දෙවන අණදෙන නිලධාරි ලෙසින් 1994 පෙබරවාරි මස 16 දින දක්වා එම තනතුර හොඹවා ඉන් පසු 1997 අප්‍රේල් මස 05 දින දක්වා අණදෙන නිලධාරි ලෙසින් 7 ශ්‍රීලපාහ ඒකකයේ නියමුවා විය.

7 ශ්‍රීලපාහ ඒකකය සමඟින් රාජකාරී කාල වකවානුව වේදී ප්‍රථම ක්‍රියාන්විතය වූ 1993 අගෝස්තු මස 28 දින සිදු කළ **සර්ප දෂ්ඨ**, ඉන් පසු 1993 සැප්තැම්බර් මස 26 ආරම්භ කළ **යාල්දේවි** ක්‍රියාන්විතයන්ට ඒකක දෙවන අණදෙන නිලධාරි ලෙසින් විශාල දායකත්වයක් ලබා දෙන ලදී. ඉන් නොනැවතී ඒකකයේ නියමුවා ලෙසින් ද, එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට එරහිව මඩකලපුව ප්‍රදේශයේ සිදු කළ වෙල්මාරුක් පීරා සෙවීමේ ක්‍රියාන්විතයට නායකත්වය ලබාදෙන ලදී. අති උතුම් දෙවන ජුවාම් පාවුල් පාප් වහන්සේ ශ්‍රී ලංකාවට සැපත් වීම නිමිත්තෙන් 95 ජනවාරි මස 21 දින යුද හමුදාව මඟින් පිරිනැමූ සම්මාණ පෙළපාළිය සඳහා ඒකක භටපිරිස් ලබාදීම හා ආරක්ෂාව සඳහා කටයුතු සිදු කරන ලදී. **විදුලි පහර, ෂේක් හැන්ඩ්, බැරල් වෝම්අප්, තන්ඩර් ස්ට්‍රයික්** හා 1995 ඔක්තෝබර් මස 13 දින ත්‍රස්තවාදීන්ගේ ඊළාම් සිහිනයේ හදවත බඳු යාපනය නගරය හා ලන්දේසි කොටුව අත්පත් කරගැනීම සඳහා දියත් කළ **රිවිරැස** ක්‍රියාන්විතයේ ඒකකයට පැවරුණු කාර්යයන් අන් ඒකකයන්ට ආදර්ශයක් වන පරිදි භටපිරිස් හසුරවා සාර්ථකව 1995 දෙසැම්බර් මස 04 දින යාපනය නගරය අත්පත් කර ගැනීමට දායකත්වය ලබාදෙන ලදී. ඉන් නොනැවතී 1996 සැප්තැම්බර් මස 22 දින ආරම්භ කළ සත්ජය මෙහෙයුමට දායකත්වය ලබාදී 1996 සැප්තැම්බර් මස 29 දින එය ද ඉතාමත් සාර්ථකව අවසන් කර කිළිනොච්චි නගරයේ ජාතික ධජය සමඟින් 7 ශ්‍රීලපාහ ධජය ඔසවමින් නායකත්වයේ ගුණාංග පිළිබිඹු කළේය.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ අත් දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී දෙස් විදෙස් පාඨමාලාවන් රාශියක් හදාරා ඇත. විදෙස් පාඨමාලා ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්ථානය, අමෙරිකාව සහ බ්‍රිතාන්‍ය යන රටවල් වල හදාරා ඇති අතර, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මඟින් ආරක්ෂක කලමනාකරණ උසස් උපාධිය ලබාගෙන ඇත. තවද, ඉන්දියාවේ මැඩ්‍රාස් විශ්ව විද්‍යාලයේ ආරක්ෂාව හා යුද්ධෝපාය පිළිබඳ උසස් උපාධිධාරියෙක් වන මොහු ශ්‍රී ලංකාවේ බටලන්ද ආරක්ෂක සේනා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලාව හදාරා ඉතා උසස් ලෙස සමත් වූ නිලධාරියෙකි. මෙසේ ලබාගත් දැනුම් සම්භාරය යුද හමුදාවට ලබාදීමට විධායක අධිකාරි - සපුපා අම්පාර, නිලධාරි උපදේශක - යුහවිපී දියතලාව, ප්‍රමානි 1 - ක්‍රියාඅම යුහමු, සේනාවිධායක - රෙම ශ්‍රීලපාහ, නිලධාරි









උපදේශක - ආසේඅමාවි බටලන්ද, 516 බළසේනාධිපති, 223 බළසේනාධිපති, බුද්ධි අධ්‍යක්ෂක, පාබල අධක්ෂක හා 53 සේනාංකාධිපති වශයෙන් තනතුරු දරා ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සාම සාධක රාජකාරි සඳහා හයිටි රාජ්‍ය වෙත යාමට මුලින්ම ආරම්භ වූයේ 2004 වර්ශයේදීය. එහි ප්‍රථම අණදෙන නිලධාරි ලෙසින් ශ්‍රී ලංකා නාමය බබලවන්නට හැකි වී ඇත. ඒ පිළිබඳව කෙටි සටහනක් කළ යුතු වන්නේය. යුද විශාරදයන් ලෙසින් හඳුන්වන අමෙරිකාව, බ්‍රසීලය, චීනය, පාකිස්ථානය, ඉන්දියාව, චිලි, ඉක්වදෝර්, ජෝර්දාන්, පිලිපීනය සහ ආජන්ටිනා රටවල් වල හටපිරිස් හයිටි රාජ්‍යයේ සාමසාධක රාජකාරි නිරත වෙමින් සිටියදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා බළඇණියක සේවය ලබාදීමට 2004 වර්ෂයේදී සිදු කරනු ලදී. හයිටි පොලිස් ස්ථානයක් වන පෙටිට්ගෝවේ පොලීසිය කැරලිකරුවන්ගේ ග්‍රහනයට නතු වී තිබියදී නැවත එම පොලිස් ස්ථානය මුදවා ගැනීමට අනිකුත් රටවල් අපහොසත් වුවත් ශ්‍රී ලංකා බළඇණිය විසින් විනාඩි කිහිපයකින් එම පොලිස් ස්ථානය අත්පත් කර ගනිමින් යුද විශාරදයන්ට ශ්‍රී ලංකා යුද හමුදාව කොතරම් දක්ෂ ද යන්න ලොවටම ප්‍රදර්ශනය කළ එක් අවස්ථාවකි විය. ශ්‍රී ලංකා නාමය බබලවන්නට අභීත නායකත්වයක් ලබාදෙන ලදී. එපමනක් නොව සාමසාධක රාජකාරීන්ට ආධුනික වුවත් අන් රටවලට ආදර්ශක් වෙමින් සිදු කළ ප්‍රජා සත්කාරයන්ද කැපී පෙනුණි. හයිටි රාජ්‍යයේ පුරවැසියන්ගේ හොඳම මිතුරා වූයේද, ශ්‍රී ලංකා යුද හමුදාවයි.

ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික සේවය ලබාදීම ද, සිදු කර ඇති මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර ප්‍රථම වතාවට ඊජිප්තුවේ කයිරෝ නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නියෝජ්‍ය තානාපති ලෙසින් රාජකාරි සිදු කළේය.

ආදී නාලන්දියකු වන මොහු දක්ෂ හොකී ක්‍රීඩකයෙකු වන අතර, 1978, 1979, 1980 වර්ෂවල විද්‍යාලය නියෝජනය කරමින් ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගි වී 1981 වර්ෂයේ ජාතික පාසැල් හොකී කණ්ඩායමේ නායකත්වද උසුලා ඇත. 1995 ජූනි මස 07 වන දින විවාහ දිවියට පා තැබූයේ ධනංජනි කරුණාසේකර මැතිනිය සමඟිනි. එක් දියණියකගේ ආදරණීය පියෙකු වේ.

ශ්‍රී ලංකා පාබල හමුදාවේ වත්මන් රෙජිමේන්තු අධිපති තනතුරට අමතරව ශ්‍රී ලංකා යුද හමුදා මාස්ටර් ජෙනරාල් ශාඛාවේ අධක්ෂක ලෙසින් රාජකාරි කරනු ලබයි.

මේජර් ජෙනරාල් කේජ්ඩීජ් කරුණාසේකර ආර්එස්පි යූඑස්පී පීඑස්සී මැතිතුමන් හට ශ්‍රී ලංකා පාබල හමුදාවේ සේනාවිධායක ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් සමඟින් තෙරුවන් සරණ හා සියලු දෙවිවරුන්ගේ ආරක්ෂාව ලැබේවායි පතන්නෙමු.





# යුද්ධ හමුදාධිපති වෙත ඇසෙමු (මු) සංචාරයේදී 4ශ්‍රීලපාහ වෙතින් උණුසුම් පිළිගැනීමක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විසිවන යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් 2013.08.26 දින ආරක්‍ෂක සේනා මුලස්ථානය මුලතිව් බළප්‍රදේශයේ සංචාරයක් සිදු කළ අතර, 4 ශ්‍රීලපාහ වෙතින් සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාළියක් පිරි කමන ලදී. සම්මාන පෙළපාළියෙහි අණදීම කපිතාන් එච්ආර්ජේ පෙරේරා ශ්‍රීලපාහ ද, සම්මාන මුරයෙහි අණදීම සැරයන් නිරෝෂන් ඩබ්ලිව්එම්කේ විසින් සිදු කරන ලදී.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**



# මංගල සීනු



12 ශ්‍රීලපාහ රාජකාර්යේ නියතු නි/67320 කපිතන් පිපීඑම්එස් කරුණාපාල ශ්‍රීලපාහ හා මදුමා රන්සිමාලි රාජපක්ෂ මෙනවිය සමග 2013 ජුනි මස 10 දින සුබ මොහොතින් යුගදිවි අරඹන ලදී.



20 ශ්‍රීලපාහ ඒකකයේ නි/66422 ලුතිතන් කේඑ රෝෂාන් ශ්‍රීලපාහ හා නිලංකා මෙනවිය සමග 2013 මැයි මස 20 දින සුබ මොහොතින් යුගදිවි අරඹන ලදී.



21 (සෙවි) ශ්‍රීලපාහ ඒකකයේ නි/8944 දෙවන ලුතිතන් ඩබ්එච්ඩී සිල්වා ශ්‍රීලපාහ හා ලසිකානි ප්‍රියංගිකා මෙනවිය සමග 2013 මැයි මස 15 දින සුබ මොහොතින් යුගදිවි අරඹන ලදී.



10 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/318558 කෝප්‍රල් වීරසිංහ ඩබ්එම්එච්ජේ හා චමිලා ප්‍රියදර්ශනී මෙනවිය සමඟ 2013 අගෝස්තු මස 29 වන දින සුබ මොහොතින් යුග දිවි ඇරඹන ලදී.

# 15 ශ්‍රීලපාහ පුවත්





## 5 වසර ශිෂ්‍යත්ව ළමුන්ට සම්මන්ත්‍රණයක්

යහපත් අනාගත පරපුරක් ලොවට දායාද කිරීමට ගොඩනැගෙන්නේ මූලික අධ්‍යාපනයයි. වර්තමානයේදී එහි පළමු කඩඉම වන්නේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය ජය ගැනීම සියලු දූවා දරුවන්ගේ ඒකායන බලාපොරොත්තුව වන්නේය.

ඒ සඳහා මෙම ඒකකය විසින් තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ත්‍රි/මොල්ලිපොතාන සිංහල මහා විද්‍යාලය, ත්‍රි/සාලියපුර මහා විද්‍යාලය, ත්‍රි/ගල්මැටියාව මහා විද්‍යාලය, ත්‍රි/විජිතපුර ගැමුණු විද්‍යාලය, ත්‍රි/ජයපුර කනිෂ්ඨ විද්‍යාලය යන පාසල් වල ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටීමට නියමිත ළමුන් වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුලුවක් 2013.08.06 දින ත්‍රි/මොල්ලිපොතාන සිංහල මහා විද්‍යාලයේදී සිසු සිසුවියන් 65 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ත්‍රි/මොල්ලිපොතාන සිංහල මහා විද්‍යාලයේ විදුහල්පති විසින් දවස පුරා පවත්වන්නට යෙදුනි.

සම්මන්ත්‍රණය ආරම්භ කිරීම සඳහා සියලු ළමුන් ඒකරාශි වනතෙක් ළමුන් වෙනුවෙන් කෙටි කාටුන් වැඩ වැඩසටහනක් හා තඹගලමුව ප්‍රදේශයේ පාසල් ළමුන් වෙනුවෙන් ඒකකය විසින් මෙතෙක් සිදු කරන ලද සේවයෙන් බිඳක් පරිඝණක ආශ්‍රයෙන් පුළුල් තිර යොදා ප්‍රදර්ශණය කරන ලදී. එතුළින් 15 ශ්‍රීලපාහ ඒකකය පාසල් ළමුන් වෙනුවෙන් සිදු කර ඇති සේවාව විදහාපෑම සිදු කරන ලදී.

සම්මන්ත්‍රණයට සහභාගිවූ සියලු පාසල් ළමුන් සඳහා අනුමාන ප්‍රශ්න පත්‍රයක් මුද්‍රණය කරදීම, රස කැවිලි සමග උදෑසන කිරිතේ පානය ද, ඉතා ප්‍රණිත වූ දිවා ආහාර වේලක් සහ සවස සිසිල් පැන් පානයන් ලබාදීමට සියලුම නිලධාරි හා සෙසුනිලයින් කටයුතු කරන ලදී.

දරිද්‍රතාවය හා අඩු පහසුකම් යටතේ අධ්‍යාපනය ලබන පාසැල් දරු දැරියන් වෙනුවෙන් මෙසේ දායක වීමට ඒකකයට හැකිවීම යුද හමුදාවත්, ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙත්, ගෞරවයක් මෙන්ම සිවිල් ජනයා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය කිරීමට මහත් රුකුලක් විය.

## Bull Shark ගංගෙයි සහ 15 ශ්‍රීලපාහ

එකිනෙකට පරස්පර වචන තුනක පෙලගැස්මක් වුවද එහි අරුත්ගැන්වීම වනුයේ ගංගෙයි පාලම අසල අඩි 15ක පමණ විශාල මෝරකු (Bull Shark) ගම්වැසි ධීවරයකුගේ මාදැලට පැටලිම යන්නයි.

Bull Shark යනු අඩි 20ත් - 30ත් අතර ප්‍රමාණයක් දක්වා වැඩෙන මුහුදේදී අවස්ථානු කුලව ප්‍රචන්ඩ ලෙස හැසිරෙන බවට නම් දරා ඇති මාළුවෙකි. මෙම මත්ස්‍ය විශේෂය ශ්‍රී ලංකා සාගර කලාපය වාසබවන කරගත්තද ගොඩබිම් ආසන්නයේ ගැවසීම අති දුර්ලබ සිදුවීමකි. එමෙන්ම එම මත්ස්‍ය විශේෂය මිරිදිය ජලයේදී ඔස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව වැනි රටවල්වල ගංගා ඔස්සේ කිලෝමීටර් දහස් ගණනක් ඉහළට ගොස් මිරිදියට අනුගත වුවද ශ්‍රී ලංකාවේ මිරිදිය මිශ්‍රිත කලපුවකදී හමුවූ මුල්ම අවස්ථාව මෙය විය හැකිය. එහි තවත් විශේෂත්වය මෙම මුහුදු තිරය නිරන්තර විනෝදකාමි සංචාරක බිම් කඩක් වීම නිසාය.

ගංගෙයි පාලම යනු මහවැලි ගංගාව මුහුදට වැටෙන ස්ථානයේ පිහිටා ඇති රමනිය පාලමකි. මෙය තිස් වසරක යුද කාලසිමාව තුළ කිසිදු සංචාරකයකුගේ ඇස නොගැටුනු ඉසව්වක් වුවද, අද වන විට සියලු ශ්‍රීලාංකිකයන්ගේ ඇසිදිසි මානයට යොමුවිය යුතු ඓතිහාසික බිම්කඩක් වේ. අතීතයේ ගංගෙය (ගඟ මුහුදට වැටෙන ස්ථානය) පසු කාලිනව ගංගෙයි බවට පරිවර්ථනට වන්නට ඇතැයි සිතිමේ වරදක් නොමැති බව අපගේ හැඟිමයි.

15 ශ්‍රීලපාහ යනු ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ පස් වියක් සපුරා ඇති සොඳුරු එමෙන්ම ශ්‍රී ලංකාද්වීපයේ ඉතාම වැදගත් වූ බිම්කඩක් වන ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ආරක්ෂාව සැපයිම සඳහා ස්ථාපනය කරන ලද එකම ශ්‍රීලපාහ බළඇණියවේ. ඒකක බලප්‍රදේශය තුළ 'කින්නියා' 'උප්පාරු' හා 'ගංගෙයි' නම් ත්‍රිකුණාමලය මඩකලපුව මාර්ගයේ පිහිටා ඇති සොඳුරුතම පාලම් ත්‍රිත්ත්වය පිහිටා ඇත.



මෙම එකිනෙකට වෙනස්කමක් දක්වනු ලබන ප්‍රවෘත්තියන්ගේ අවස්ථා සම්බන්ධය ගොනුවන්නේ ගංගෙයි ප්‍රදේශයේ ධීවරයකුගේ කුඩා දැලකට Bull Shark (මොරා) අසුවීමත් සමගය. 15 ශ්‍රීලපාහ හටපරිස්වල මැදිහත්වීම මත මහවැලි ගඟ මුහුදට වැටෙන ගංගෙයි ප්‍රදේශයේ මිරිදිය ජලයෙන් හමුවූ එම දුර්ලභ මත්සයා නැවත මුහුදට මුදවා හැරීමට ධීවරයින්ගේ එකඟතාවය මත කටයුතු කරන ලදී. සත්ත්වයා ගැඹුරු දිය වෙත රැගෙන යාමට ශ්‍රී ලංකා නාවික අනුකණ්ඩය මගින් ලද සහායද මතක් කරනුයේ කෘතඥපූර්වකවය. මෙසේ වූ මනරම් ත්‍රිමලය ප්‍රදේශයේ සිරි නැරඹීමට ඔබටද එක්වන ලෙස ඇරයුම් කර මෙම සටහනේ අවසානය සනිටුහන් කරමි.

**බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ**

# 17 (සෙව්) ශ්‍රීලපාහ පුවත්




## නව අණදෙන නිලධාරී

2008.03.30 දින අභිනවයෙන් ආරම්භ කළ 17 ශ්‍රීලපාහ වන්නි මානුෂීය මෙහෙයුමට සුවිශේෂී දායකත්වයක් ලබා දී මේ වන විට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිංහපුර - ගල්කන්ද ප්‍රදේශයේ ස්ථානගතව රාජකාරි කරනු ලබයි. 2013.07.03 දින ඒකකයට තවත් සුවිශේෂී වූ දිනයක් විය. ඒ ඒකකයේ දෙවන වරට පත්වීම් ලැබූ අණදෙන නිලධාරී වශයෙන් නි/4480 මේජර් ජේඑච්එම්එස්එස් ජයසුන්දර ශ්‍රීලපාහ වැඩ භාර ගැනීමයි.

ඒකකයේ හටපිරිස් විසින් කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීමෙන් අනතුරුව චිරාගත සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දල්වා මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ සියලු නිලයින්ගේ ආශිර්වාදය මැද පුරා අවුරුද්දකට ආසන්න



කාල සීමාවක් ඒකකයේ වැඩබලන අණදෙන නිලධාරී වශයෙන් රාජකාරි කළ නි/5016 මේජර් ඒඑස් කුමාර ශ්‍රීලපාහ විසින් 2013.07.03 දින පෙරවරු 1017ට යෙදුනු සුබ මොහොතින් නව අණදෙන නිලධාරී හට වැඩ භාරදීම සිදු විය.



නව තනතුරේ වැඩ භාර ගැනීම නිමිත්තෙන් අණදෙන නිලධාරී විසින් කඳවුරු භූමියේ අඹ පැළයක් රෝපණය කරන ලද අතර, ඒකකයේ සියලුම දෙනා අමතමින් හරවත් දේශණයක්ද සිදු කරන ලදී. එහිදී වසර 06 කට ආසන්න කාලයක් ඒකකය අභියෝග, බාධක ජය ගනිමින් කුරිරු ත්‍රස්තවාදීන්ගෙන් රට මුදවා ගැනීමට දායක වෙමින් පැමිණි සාර්ථක ගමනට උරදුන් හිටපු අණදෙන නිලධාරිවරුන්, අනෙකුත් නිලධාරීන් හා සෙසුනිලයින්ද, රණබිමේදි දිවි පිදු සියලුම රණවිරුවනුත්, යුද බිමේදී තුවාල ලැබූ සියලුම දෙනාට ස්තුතිය හා ප්‍රණාමය පුදකරන බව පැවසීය. පසුව ඒකක හටපිරිස් විසින් සංවිධානය කරන ලද තේ පැන් සංග්‍රහයටද සහභාගි විය.




ඒකකයේ අණදෙන නිලධාරී තනතුරේ රාජකාරි ගමන ආරම්භ කරනා ඔබට ඒකකයේ සියලුම නිලයින්ගේ සුබාශිංසන ගෙන එනු ලබන අතර, ඒකකයේ නාමය තව තවත් ඉදිරියට රැගෙන යාමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය මෙන්ම දෙවියන්ගේ රැකවරණය හා රත්නත්‍රයේ පිහිට ආරක්ෂාව නොඅඩුව ලැබේවා යි ප්‍රාර්ථනා කරන්නෙමු.



## සෙසුනිල භෝජනාගාරය විවෘත වූදා

17 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සෙසුනිලයින් වෙනුවෙන් ඒකකය ස්ථානගත සිංහපුර - ගල්කන්ද කඳවුරේ අභිනවයෙන් ඉදිවූ සෙසුනිල භෝජනාගාරය 2013 ජූලි මස 03 වන දින යෙදී තිබූ සුබ මොහොතින් ඒකක අණදෙන නිලධාරී මේජර් ජේඑච්එම්එම්එස් ජයසුන්දර ශ්‍රීලපාහ විසින් විවෘත කර සෙසුනිලයින්ගේ පරිභෝජනය සඳහා ලබා දෙන ලදී.

**බළඇණි කාර්යාලය - 17 (සෙව්) ශ්‍රීලපාහ**

# 20 ශ්‍රීලපාහ පුවත්

## දෙමළ භාෂා පුහුණු පාඨමාලා අංක 05 හා 06 විසිරගිය වගයි

යුද හමුදාවේ ක්‍රියාන්විත තත්ත්වය හා ව්‍යාපෘතීන් අවසන් වීමත් සමගම සාමකාමී වාතාවරණය තුළින් සමස්ත යුද හමුදාව වෙත පැවරෙන ලද අවතැන් වූ සිවිල් ජනතාව නැවත පදිංචි කරවීම හා ඔවුන් සම්බන්දයෙන් කරන කටයුතු විදිමත්ව සිදුකිරීම උදෙසා දෙමළ භාෂා දැනුම සියලුම යුද හමුදා අයවලුන් වෙත ලබාදීම තුළින් ප්‍රදේශයේ දමිළ ජනතාව හා යුද හමුදා අයවලුන් අතර සමීප සම්බන්ධතාවයන් ගොඩ නැගීම අරමුණ කොට ගනිමින් ආසේමු (කිලි) ආඥාපතිගේ සංකල්පයකට අනුව කිලිනොච්චි බළප්‍රදේශය තුළ සේවය කරන යුද හමුදා නිලධාරි හා සෙසුනිලයින්ගේ ත්‍රෛ භාෂා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදී.

ඒ අනුව මෙම ඒකකය තුළ රාජකාරි සිදු කරනු ලබන අයවලුන් අතුරින් දෙමළ භාෂා පාඨමාලා අංක 05 සහ 06 හදාරන ලද නිලධාරින් හා සෙසුනිලයින් 78 දෙනෙකු හට 2013.05.30 දින ආසේමු (කිලි) ආඥාපතිගේ සුරතින් සහතික පත්‍ර ලබා ගෙන විසිර ගියහ.

මෙම ඒකකයේ රාජකාරි කරනු ලබන නිලධාරින් හා සෙසුනිලයින් 350 කට අධික ප්‍රමාණයක් දමිළ භාෂා දැණුම වර්ධනය කිරීමට හැකි වූ අතර, ඒ තුළින් ප්‍රදේශයේ රාජකාරී ඉටු කිරීමේදී ඔවුන්හට මහත් පහසුවක් වනවා නොඅනුමානය.

ආසේමු (කිලි) ආඥාපති ඇතුලු බළප්‍රදේශයට අයත් සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ අධීක්‍ෂනය කැපවීම තුළින් මෙසේ සාර්ථකව දමිළ පාඨමාලාවන් හැදෑරීමට හැකිවිය. ඔවුන් සියලු දෙනාහට අපගේ ඒකකයේ ස්තූතිය මෙසේ පිරි නමන්නෙමු.

### සම්බුද්ධ තෙමඟුල සැමරුම



සම්බුදුපියාණන්ගේ තෙමඟුල එළැඹුණු බැතිබර වෙසක් පුන් පොහෝ දින ප්‍රතිපත්ති පූජාවන්ට මුල්තැන දෙමින් 20 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ඇතුලු සියලුම අයවලුන් විසින් 2013.05.24 වන දින මුක්කම්පන් පුනරීන් ප්‍රදේශයේ මහා බත් දන්සලක් හා සිසිල් පැන් දන්සැලක් පවත්වන ලදී. දන්සල බුක්ති වීම සඳහා ප්‍රදේශයේ දමිළ වැසියන් 2000කට අධික පිරිසක් සහභාගි වූහ. එදින සන්ධ්‍යාවේ කඳවුරු විහාරස්ථාන භූමියේදී බෝධි පූජා පිංකමක් හා සුමදුර ධර්ම දේශනාවක් පැවැත්වීමද කටයුතු සිදු කරන ලදී.

ආසේමු(කිලි) ආඥාපතිගේ සංකල්පයකට අනුව කිලිනොච්චි මහා විද්‍යාලීය ක්‍රීඩාංගනයේදී පවත්වන ලද වෙසක් උත්සවයෙහි පහන් කූඩු ප්‍රදර්ශණය සඳහා මෙම ඒකකය වෙතින් දර්ශණීය පහන් කූඩුවක් නිර්මාණය කර 2013.05.24 දින සිට 2013.05.31 දින දක්වා ප්‍රදර්ශනය කරන ලදී. එම ස්ථානයේද පැවත්වූ දිවා/රාත්‍රි බත් දන්සල සඳහා ඒකක අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින්ගේ දායකත්වය ලබා දී සම්බුදුපියානන්ගේ තෙමඟුල උත්සවශ්‍රීයෙන් සැමරීමට හැකි විය.

**බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ**

# 24 ශ්‍රීලපාහ පුවත්


## සම්බුද්ධ තෙමඟුල සැමරුම

බුද්ධ වර්ෂ 2557 ක් වු වෙසක් මස පුර පසළොස්වක පොහොය දිනය යෙදී තිබුනේ 2013.05.24 දිනටය. 24 වන ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලධාරින් හා සෙසුනිලයින්ගේ බැතිබර දායකත්වයෙන් වව්නියාව මන්නාරම් මාර්ගයේ පුදුක්කුලම් මංසන්ධියේදී තෙවන වරටත් දිවා කාලයේ මහ බත් දන්සලක් පවත්වන ලදී. මෙම දන්සල මගින් වන්දනාවේ පැමිණි බොහෝ දෙනෙකුට දිවා ආහාරය ලබාදීමට හැකියාව ලැබුණි.

එදින රාත්‍රි 1900 පැයට පමණ කඳවුරු භූමියේ පිහිටි බුදු මැදුරේ විදුලි බුබුලු වලින් විචිත්‍රවත් ලෙස ආලෝකමත් කර පහන්කූඩු දල්වා ඒකාලෝක කළේය. පසුව ගරුතර මහා සංඝරත්නය වැඩමකරවා බෝධිපූජා පිංකමක් සිදු කිරීමෙන්ද, සිද්ධාර්ථ කුමාර උත්පත්තිය, සම්මා සම්බුද්ධත්වය හා සම්බුද්ධ පරිනිර්වානය යන උතුම් වූ සම්බුදු තෙමඟුල බැතිබර සිතින් අප හටපිරිස් විසින් සැමරූහ.

**බුද්ධි අංශය - 24 ශ්‍රීලපාහ**





# 24 ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර

අප බළඇණිය 213 බළසේනාව යටතේ ස්ථානගතව සෙට්ටිකුලම් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 21 ක ජීවත්වන සිංහල දමිළ මුස්ලිම් වැසියන්ගේ සුබසාධක කටයුතු පිළිබද සොයා බලනු ලැබේ.

ඒකක අණදෙන නිලධාරි ගේ සංකල්පයක් අනුව හා මග පෙන්වීම යටතේ කණ්ඩායම් නිලධාරි අණදෙන වරුන්ගේ සහයෝගය ඇතිව මෙම ඒකක බළ ප්‍රදේශයේ ජීවත්වන සිවිල් වැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සදහා 2013.08.27 දින පාවට්කුලම් යුනිට් හය ප්‍රජා ශාලාව තුළදි දන්ත හා සර්වාංශ රෝග සඳහා වෛද්‍ය සායනයක් පවත්වන ලදී. මේ සඳහා වව්නියාව මහ රෝහලේ දන්ත වෛද්‍ය හා සර්වාංග රෝග පිළිබඳ විශේෂ වෛද්‍යවරුන්ගේ පූර්ණ සහයෝග ලබා දුන්හ.

මෙම සායනයෙන් ප්‍රදේශයේ ජීවත්වන විවිධ ජාතින්ට අයත් වැඩිහිටියන් තරුණ තරුණියන් සහ කුඩා දරුවන් විශාල සංඛ්‍යාවක් වෛද්‍ය පරීක්ෂනයන්ට ලක් කර ප්‍රතිකාර ලබාදීමට හැකි විය. මෙම සත්කාරයෙන් විවිධ ජාතින්ට අයත් ජනතාව සමග එක්ව දේශයේ උණ්නැතිය උදෙසා සිදු කරන ලබන සිවිල් සම්බන්ධිකරණ කටයුතු සිදු කිරිමට මහගු පිටුවහලක් සේම සමස්ත යුද හමුදා කෙරෙහි ජනතා සිත් තුළ පැහැදිලි දක්මක් ඇති කරලීමට දරු උත්සහයක ප්‍රතිඵලයක් වශයෙන් සනිටුහන් කළ හැක.

**බුද්ධි අංශය 24 ශ්‍රීලපාහ**





## තවත් දමිළ තරුණියන් රැසක් යුද හමුදා සේවයට එක්වුනු වගයි




ප්‍රදේශයේ ජීවත්වන දමිළ වැසියන් යුද හමුදාව කෙරෙහි තබා ඇති දුර්ලබ ආකල්ප වෙනස්කර ශ්‍රී ලංකා යුද හමුදාව සම්බන්ධයෙන් ඔවුන් විවිධ අයුරින් දැණුවත් කිරිම් සිදු කර යුද හමුදා කාන්තා බළකායට මෙම ඒකක බළ ප්‍රදේශය තුළින් දමිළ තරුණියන් පස් දෙනෙකු 2013.08.28 දින ආසේමු (වන්නි) හිදි ආරම්භ වූ ආධුණික කාන්තා සෙබලියන් පුහුණු කිරිමේ පාඨමාලාවට සහභාගි කරවිමට හැකියාව ලැබුණ බැව් සතුටින් යුතුව දන්වා සිටිමු.


මෙම මහගු අවස්ථාව සදහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආසේමු (වන්නි) ආඥාපති, 21 සේමු සේනාංකාධිපති, 213 බළසේනාධිපති හා ඒකක අණදෙන නිලධාරි ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරින් ද, ප්‍රදේශයේ ප්‍රභූ පිරිස් සහ විවිධ ජාතින්ට අයත් ප්‍රදේශවාසින් ද, විශාල සංඛ්‍යාවක් සහභාගි වන ලදී. මෙමඟින් ප්‍රදේශයේ සහ දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ජීවත්වන නොයෙකුත් ජාතින්ට අයත් ජන කොටස්හි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කෙරෙහි තබා ඇති විශ්වාසය තව දුරටත් වර්ධනය වීමක් ලෙස සැලකිය හැකිය.

**බුද්ධි අංශය 24 ශ්‍රීලපාහ**





# 25 ශ්‍රීලපාහ පුවත්





## බළඇණි දින සංවත්සර

25 ශ්‍රීලපාහ 2010.09.20 දින පළවන වන්නි ආධාරක බළඇණිය ලෙස ආරම්භ වූයේ මිලේච්ඡ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමට තම ජීවිතය පවා පරදුවට තබමින් සටන්කළ වීරෝදාර නිලධාරින් හා සෙසුනිලයින්ගෙන් ඒකරාශි වීමෙනි. එවන් වූ බළඇණියක විශිෂ්ට වු ගෞරවයකට උරුමකම් කියන අප අභිමානවත් අතිතයේ තෙවන සංවත්සරය සමරනුයේ නිහතමානි ආඩම්බරයක් සියලු දෙනාගේ සිත් හි දරා ගනිමිනි. ත්‍රස්තවාදීන් සමඟ මුහුනට මුහුණ සටන් කරමින් සිය ඒකකයේත්, රෙජිමේන්තුවේත්, සමස්ත යුද හමුදාවේත් ගෞරවය ආරක්ෂා කරමින් සංග්‍රාමික විනය නිරන්තරයෙන් ආරක්ෂා කර ගනිමිනි. මව්බිමේ නාමය ජාත්‍යන්තරය හමුවට රැගෙන යන්නට ජීවිත පරිත්‍යාග කළ හා පූර්ණ ආබාධිතව පසුවන අපේ විරුවන්ද සිහිකරන්නට අප අමතක නොකළෙමු. ඔවුන් සිහිකිරීම උදෙසා අනුරාධපුර ශ්‍රී මහා බෝ සමිදුන් අබියස බෝධි පූජාවක් පැවැත්වූයේ සියලු ජාතින් වෙනුවෙන් තම හිමි ජීවිතය අහිමි වූ සියලු විරුවන්ගේ නම ඉදිරියේ අරලිය මලක් හා පොල්තෙල් පහනක් තබා උපහාර දක්වමිණි. සදාදරණිය වූ එම රණවිරුවන්ට පිං පැමිනවීම සහ ආබාධිත විරුවන් හට සෙත් පැතීම අරමුණු කර ගනිමින් මඩු පල්ලියේහිදී  දේව මෙහෙයක් පැවැත් වූහ.

නි/62242 ලුතිතන් කර්නල් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ඒකකයේ අභිමානවත් අතීතය ආරක්ෂා කරමින් ඒකකයේ උන්නතිය හා රදා පැවැත්ම වෙනුවෙන් දිවිහිමියෙන් ඒකකය නංවාලීමෙහිලා කාලීන මෙහෙවරෙහි නිරත වෙමින් ඒකකයේ නියමුවා වශයෙන් කාර්යභාරය ඉටු කරනු ලබයි.

ඒකකයේ තුන්වන උපන් දිනය සමරණ මොහොතේ ඒකකයට නායකත්වය ලබාදුන් හිටපු අණදෙන නිලධාරිවරුන් සිහිපත් කරනුයේ මහත්  වු ගෞරවයකිනි. සංවත්සර දිනය අර්ථ ගන්වමින් සියලු හටපිරිස් අණදෙන නිලධාරි වෙත කෘතගුණ සැලකීම වස් 2013.09.20 දින කඳවුරු මුරයක් හා සම්මාන පෙළපාළියක් පිරිනමන ලදී. එදිනම සියලු නිලයින් නියෝජනය වන පරිදි තේ පැන් සංග්‍රහයක් හා දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීමෙන් පසුව 25 ශ්‍රීලපාහ තෙවන සංවත්සරය අවසන් වන ලදී. අවසන් වශයෙන් ඒකකයේ උන්නතිය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ අපේම සදාදරණිය විරුවන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, ආබාධිත තත්ත්වයේ පසුවන සියලු රණවිරුවන්ට ඉක්මන් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

**මූලස්ථානය  25 ශ්‍රීලපාහ**








# රෙජිමුබ ශ්‍රීලපාහ පුවත්

## රණක්ෂයට පත් ශ්‍රීලපාහ ක්‍රීඩා තරු කතරගම සංචාරය



දශක 03 කට අධික කාලයක් තිස්සේ මාතෘභූමිය රැක ගැනිමට විශාල මෙහෙවරක් ඉටු කළ ශ්‍රී ලංකා පාබල හමුදා විරුවන් රණක්ෂයට පත් වීමෙන් පසු රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ශ්‍රීලපාහ ඒකකය යටතේ රාජකාරි කරනු ලබයි. කුරිරු යුද්ධය නිමා කිරීමට තම කායදානයෙන් යුදබිමේදි ලබාදුන්නා සේම යුද්ධයෙන් පසු රටේ සාමය හා ඒකීයභාවය ඉදිරියටත් රැක ගැනීමට මෙම විරුවන් මහත් වෙහෙසක් ගනු ලබයි. තවද රණක්ෂයට පත් වුවත් තම ක්‍රීඩා කුසලතා ඔප්නංවා ගනිමින් ජාතික සහ ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීමටත්, මෙම විරුවන් නොමදව කටයුතු කරනු ලබයි. පාබල මැණියන්ගේ



රණක්ෂයට පත් ක්‍රීඩා තරු මෙම වසරේ ලද පළමු ජයග්‍රහණය වන්නේ XIII වන ජාතික පැරා තරඟාවලියේ ජවන හා පිටිය ශූරතාවය හා සමස්ත අනු ශූරතාවය දිනා ගැනිමට සමත් විය. රෙජිමේන්තු අධිපතිගේ උපදෙස් පරිදි රෙජිමුබ ශ්‍රීලපාහ අණදෙන නිලධාරිගේ මඟ පෙන්වීම යටතේ සියලු දෙනා එකතුව ලද ජය සැමරීමටත්, ඉදිරියේදී පවත් වනු ලබන ක්‍රීඩා ඉසව් ජයග්‍රහණය කිරීමට ශක්තිය ධෛර්ය ලබාගැනිමටත්, රෙජිමුබ ශ්‍රීලපාහට අයත් සියලුම රණවිරුවන්ට සෙත් පතා පුද පූජා පැවැත්වීම සඳහා කතරගම පූජා භූමිය වෙත වන්දනා චාරිකාවක් සංවිධානය කරන ලදී.

කතරගම වන්දනා චාරිකාව 2013 මැයි මස 05 දින අලුයම 0500 පැයට අණදෙණ නිලධාරි පෙරටු කොට ගනිමින් නිලධාරි 09 දෙනෙකුගෙන් සහ ක්‍රීඩා කණ්ඩායමේහි සෙසුනිලයින් 145 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් වන්දනා චාරිකාව සඳහා රෙජිමුබ ශ්‍රීලපාහ පනාගොඩ කඳවුරෙන් පිටත් වන ලදී.

එදින උඩවලව ජාතික වනෝද්‍යාන වැව් තාවුල්ලේ සිට සිසිල් සුළං විඳිමින් උදෑසන ආහාර ලබා ගැනිමෙන් අනතුරුව දිවා ආහාරය සඳහා කතරගම නිවාඩු නිකේතනය බලා ගී ගායනා මැද ගමන් කරන ලදී. දිවා ආහාරය ලබා ගැනිමෙන් අනතුරුව සවස 1600 පැයට සැදැහැ සිතින් පේවී කතරගම කිරිවෙහෙර චෛත්‍ය වහන්සේ ඉදිරිපිට සිට ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති ඇතුළු සියලු දෙනාට සෙත් පතා සුමධුර දහම් දෙසුමක් පවත්වන ලදී. ඉන් පසු කතරගම දෙවිදුන්ට බාරහාර වීම සඳහා කාවඩි පෙරහැරක් මධ්‍යයේ පූජා වට්ටි පෙරටු කොට ගෙන ගමන් කර පසුව සවස 1830 පැයට පැවැති දේව පූජාවට, ඉදිරි තරඟ ජයග්‍රහණය කිරීමට හා රෙජිමුබ ශ්‍රීලපාහ සියලු දෙනාගේ ඉදිරි කටයුතු සාර්ථකව ඉටුකර ගැනිමට ශක්තිය ධෛර්යය ලැබේවායි පතමින්ය. අණදෙන නිලධාරිගේ මුලිකත්වයෙන් පුද පූජා පවත්වා අවසානයේ සියලුම දෙනා සතුටු සිතින් නැවත නිවාඩු නිකේතනය වෙත පැමිණ රාත්‍රී ආහාර ලබා ගෙන ගමන් වීඩා නිවා ගනු ලැබූහ.

පසුදින දින උදෑසන ආහාරය ගැනිමෙන් අනතුරුව කතරගම පූජා භූමියෙන් සමුගෙන නැවත කඳවුර බලා ඒමට පිටත් වන ලදී එන මඟ අතරතුර සෙනින්ගේ දැණුම වැඩුම සඳහා මත්තල මහින්ද රාජපක්ෂ ගුවන් තොටුපල වෙත ගමන් කර එහි සියලු ක්‍රියාකාරිත්වය පිළිබඳ පූර්ණ අවබෝධයක්



කාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් ලබාදෙන ලදී. ගුවන් තොටුපලෙන් සමුගත් අප හම්බන්තොට වරායට ගොස් එහි අසිරිය හා එහි නිමැවුම පිළිබඳ අවබෝධයක් ලබා අනතුරුව එතැනින් පිටත්ව හබරාදුව මුහුදු තීරයේ සිට දිවා ආහාරය සියල්ලන් එක්ව රසවිඳ 2200 පැයට කඳවුර තුළට පැමිණීමෙන් චාරිකාව නිමා වන ලදී.

මෙම චාරිකාවෙන් ලබාගන්නා වූ නව පන්නරයෙන් හා ආශිර්වාදයෙන් ඉදිරි තරඟාවලින් හා බළඇණියේ සියලුම කටයුතු සාර්ථක කර ගැනිමට ශක්තිය ධෛර්ය ලැබේවායි අපි ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය රෙජිමුබ ශ්‍රීලපාහ**



# ශ්‍රීලපාහ ක්‍රීඩා පුවත්

## 2013 අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා තරගාවලිය යුද හමුදා ස්වේච්ඡා බලසේනාව





ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර් රෙජිමේන්තු ස්වේච්ඡා බලසේනා මලල ක්‍රීඩා තරගාවලිය මෙවරත් 2013 ජුලි මස 16,17 සහ 18 යන දිනයන්හීදී කොළඹ සුගතදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගණයේ අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

උක්ත තරගාවලිය සඳහා සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩක/ක්‍රීඩිකාවන් 1500 ක් පමණ සහාභාගි විය. ශ්‍රීලපාහ රෙජිමේන්තුව නියෝජනය කරමින් ක්‍රීඩකයින් 52 දෙනෙකුගෙන් යුත් මලල ක්‍රීඩා කණ්ඩායමක් සහාභාගි වූහ.

පුරා තෙදිනක් තුළ පැවැති මෙම තරගාවලියේ ක්‍රීඩකයින් දක්වන ලද දක්ෂතා හේතුවෙන්ම සියලුම රෙජිමේන්තු තියුණු මුහුණුවරක් ගත් අතර, ශ්‍රීලපාහ ක්‍රීඩකයින්ගේ විශේෂිත දක්ෂතා මත සියලුම රෙජිමේන්තු අතුරින් සමස්ත තරගාවලියේ අනුශුරතාවය දිනා ගැනිමට සමත් විය.

තවද මෙම තරගාවලියට සමගාමීව කඹ ඇදීමේ තරගාවලිය ද පැවැති අතර ශ්‍රීලපාහ ක්‍රීඩකයින් අවසන් මහා තරගය සදහා සුදුසුකම් ලැබීය.

ඒ අනුව මලල ක්‍රීඩා තරගාවලියේ සමාප්ති උළෙල සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තන් වශයෙන් පැමිණියේ එවකට යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව් ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, ස්වේච්ඡා බලසේනාධිපති මේජර් ජෙනරාල් ඒඩබ්ජේසී ද සිල්වා ආර්ඩබ්පී යුඑස්පී එන්ඩීයූ පීඑස්සී, ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ඩීඑල්පී වික්‍රමසිංහ ආර්එස්පී කේඑස්වී සහ ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැසක්ද සහාභාගි වූහ.

ප්‍රධාන ආරාධිත අමුත්තන් ඉදිරියේ කඹ ඇදීමේ අවසන් තරගය පැවැති අතර සියලුම ආරාධිත අමුත්තන් සහ තරගාවලිය නැරඹීමට පැමිණි සිටි අයලුවන් අමන්දානන්දයට පත් කරමින් තරග වට 3/2 ක් වශයෙන් ජයග්‍රහණය කර 2013 වසරේ කඹ ශුරතාවය ශ්‍රීලපාහ රෙජිමේන්තුව ඉදිරියේ සනිටුහන් විය.





## සාමසාධක රාජකාරි නිමාවෙන් පසු පැමිණ ක්‍රීඩා අංශය වෙත ලබා දුන් පරිත්‍යාග

ක්‍රීඩා අංශයේ රාජකාරි කරනු ලබන ක්‍රීඩා සෙනින් හයිටි රාජ්‍යයේ සාම සාධක රාජකාරි සඳහා ගොස් එහි සාර්ථකව රාජකාරි නිමාවෙන් පසු මෙම අංශය වෙත පැමිණ ඔවුන් විසින් ශ්‍රීලපාහ ක්‍රීඩා අංශයේ ක්‍රීඩා සෙනින්ගේ සුබ සාධනය සදහා රුපියල් 33900.00 ක් වටිනා අඟල් 32 ක වර්ණ රූපවාහිනී යන්ත්‍රයක් ක්‍රීඩා භාර නිලධාරි ලුතිතන් කර්නල් පීඑච්එම්එම් පෙරේරා ශ්‍රීලපාහ වෙත පරිත්‍යාග කරන ලදී.



ක්‍රීඩා අංශය රෙම ශ්‍රීලපාහ

මෙම පරිත්‍යාගය සිදු කළ අයවළුන් සෙ/304882 කෝප්‍රල් මහින්ද එල්ඩී, සෙ/303896 කෝප්‍රල් කුමාරසිංහ එස්එම්ටීඑස්, සෙ/314797 කෝප්‍රල් පුෂ්පකුමාර අයිඑම්ආර්, සෙ/319099 කෝප්‍රල් අබේසේකර එස්එන්, සෙ/00535 කෝප්‍රල් බණ්ඩාර ටීබීජී, සෙ/317653 ලාකෝ චතුරකුමාර අයිඑල්, සෙ/318925 ලාකෝ රත්නායක ආර්එම්ටීඑස්, සෙ/318774 ලාකෝ දිසානායක ඩීඑම්ආර්, සෙ/319089 ලාකෝ ප්‍රියන්ත කේපීඑස්, සෙ/319096 ලාකෝ ඉරේෂ් ඩබ්ජ්, සෙ/322088 ලාකෝ රණසිංහ වීපීපී, සෙ/01057 ලාකෝ සමන් බණ්ඩාර ජීජීඩී, සෙ/01048 ලාකෝ ජයසිංහ ඊජී, සෙ/01057 ලාකෝ අජන්තන් එම්, සෙ/01058 ලාකෝ හිටිගෙදර ඒබී, සෙ/06232 සාසෙ බණ්ඩාර ඒජීජ්.

# 4 ශ්‍රීලපාහ පුවත්



## විසිහය වන බළඇණි දින සැමරුම

1987.05.05 දින මංකිබ්‍රිජ් යුද හමුදා කඳවුරේදි ලුතිතන් කර්නල් යූජ් ගුණර්ධන ශ්‍රීලපාහගේ නායකත්වය යටතේ ස්ථාපිත වු 4 ශ්‍රීලපාහ ඒකකය මේ වන විට සිය 26 වන ජන්ම දිනය පසුකල බැව් සිහිපත් කරනුයේ මහත් අභිමාණයෙනි. වසර 30 අධික කාලයක් පැවැති කුරිරු යුද්ධය  නිමා කිරිම සදහා අභිත නායකයින් 15 දෙනෙකු යටතේ අවසන් මානුෂිය මෙහෙයුම තෙක් සක්‍රිය දායකත්වයක් සපයා ඇත. දැනට 4 ශ්‍රීලපාහ ඒකකය ප්‍රධාන වශයෙන් සිවිල් පාලන කටයුතු සිදු කරමින් වත්මන් අණදෙන නිලධාරි මේජර් පීඩීජේසී ප්‍රේමතිලක පීඑස්සී ශ්‍රීලපාහගේ නායකත්වය යටතේ මුල්ලයාවේලි ප්‍රදේශයේ රාජකාරි කරමින් සිටි.

මෙම බළඇණි දිනයට සමගාමිව ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් 2013.05.04 වන දින අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධිය අභියසදි ඒකක ධජයට සෙත් පැතිම අණදෙන නිලධාරි තුමන් ප්‍රමුඛ නිලධාරි සහ සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදි. මීට අමතරව 2013.05.02 දින ඒකක අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් පිරිනැමීමෙන් පසු සියලු නිලයන්ගේ සහභාගිත්වයෙන් තේ පැන් සංග්‍රහයක් භුක්ති විදින ලදී. ඉන් අනතුරුව සියලු නිලයන් ඇමතීම ඒකක අණදෙන නිලධාරි විසින් සිදු කළේය. එහිදි දැනට ඒකකය තිබෙන තත්ත්වයට වඩා උසස් මට්ටමකට ගෙන ඒම තමගේ බලාපොරොත්තුව බවත්, ඒ සදහා සියලුම අයවලුන් එකට එකතුවී වැඩ කලයුතු බවත්, ප්‍රකාශ කරන ලදී. තවද රටේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩත්වය වෙනුවෙන් දිවිපිදූ හා තුවාල සිදුවන ලද සියලුම රණවිරුවන් සිහිපත් කරමින් ඉතා හරවත් දේශණයන් සිදු කරන ලදී. පසුව සකස් කර තිබු විශේෂ දිවා ආහාරය සියලු නිලයින්ගේ සහභාගිත්වයෙන් භුක්ති විදින ලදී. 2013.05.06 දින වට්ටපලෙයි කෝවිලෙහි පූජාවත් පැවැත් වූ අතර, ඉන් අනතුරුව මුරිප්පු විද්‍යාලයේ සිසු සිසුවියන් වෙත කැවිලි පාර්සල් බෙදාදීම අවසන් අධියර වශයෙන් සිදු කර බළඇණි දින උත්සව කටයුතු නිමා කරන ලදී.



වසර 26 ක සාර්ථක කමනක් පැමිණ සිටින අප ඒකකය ඉදිරි ගමනද සාර්ථකත්වයෙන් සාර්ථකත්වටය පත් කිරිමට අවැසි ශක්තිය ධෛර්ය අණදෙන නිලධාරි ඇතුලු ඒකකයේ සියලු අයවලුන්ට ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**















# උතුරත් දකුණත් එක් කළ මල් හී සර



**"යුද්ධය උපදින්නේ මිනිසාගේ සිත තුළය. එමෙන්ම සාමය උපදින්නේද මිනිසාගේ සිත තුළය".**

යන රුවන් වැකිය සාක්සාත් කරමින් තිස් වසරක පැවති කුරිරු යුද්ධය නිමාවත් සමඟ සාමයේ අරුණලු උදාවිය. උතුරේ මෙන්ම දකුණේ සිත් සතන් තුළ යුද ගිනිදැල් වලින් පැරුණු හදවත් සුවපත් කිරීමට ඉතා වෙහෙස මහන්සියක් ගැනීමට සිදු විය. එම කාර්යයන් ත්‍රිවිධ හමුදාව විසින් සිදු කරද්දී 23 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/330559 ලාකෝ සිරිමල් ඩීආර් ජාති ආගම් කුල බේද දුරලා මුලතිව් පොන්නගර් ගම්මානයේ පදිංචි ජේසු දාසන් මේරි තෙරේසා සමඟ විවාහ ගිවිස ගන්නා ලදී. මෙසේ දමිළ තරුණියක් සමඟ ආදරයෙන් බැඳුනු සිත් එක් කළ දිනක් උදාවිය. 2013 ජුනි මස 30 දින මුල්ලියාවේලි දේවස්ථානයේදී අතිනත ගෙන 591 බළසේනා මූලස්ථාන නුග සෙවන නිවාඩු නිකේතනය මංගල පවත්වන ලදී.



උතුරේ මෙන්ම දකුණේ හදවත් මෙසේ එක් කිරීමට ආරක්‍ෂක අමාත්‍යංශයෙන් හා ආසේමු (මුලතිව්) වෙතින් ලද පූර්ණ අනුමැතියෙන් 23 ශ්‍රීලපාහ ඒකකයේ වියදමින් මෙම අපූරු මංගල්‍ය සිදු කිරීමට හැකිවිය. අද රටට අවශ්‍ය මෙවැනි සිත් එක්වන යුගයකි. මෙවන් කාර්යයන් සිදු කිරීමට වෙහෙස මහන්සි වූ මේජර් ජෙනරාල් ලෙනාඩ් මාර්ක්, බ්‍රිගේඩියර් ධම්මික පනංවල, බ්‍රිගේඩියර් ජයවර්ධන, බ්‍රිගේඩියර් ඇහැලමල්පේ, බ්‍රිගේඩියර් සරත් වීරවර්ධන, කර්නල් සීඩී වීරසූරිය යන ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා 23 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරින් මේ මොහොතේ සිහිපත් කළ යුතු වන්නේය.

මේ සොඳුරු කැදැල්ල වෙත රෙජිමේන්තුවෙන් තවත් මංගල ත්‍යාගයක් ලබාදීමට රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් තීරණය කර ඇත. එනම් නව යුවල වෙත නව නිවසක් ඉදිකර දීමයි. ඉදිරියේදී එය ඔවුන් දෙදෙනා හට ලබාදීමට සැලසුම් සිදු කර ඇත.

උතුරු දකුණ යා කරමින් මල් හීසර මතින් අතිතන ගත් ඔබ දෙදෙනා විසින් ගත් මඟ ගැනීමට තවත් දහසක් තරුණ තරුණියන්ට ආරාධනා කළා වැනිය. මෙවැනි ක්‍රියාව රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම නිලයින්ගේ උනුසුම් සුබ පැතුම් මෙසේ එක් කරන්නෙමු.

**බුද්ධි අංශය**
**23 ශ්‍රීලපාහ**








2013 ජුනි මස 14 දින තෙවන උපන් දිනය සැමරූ 1 ශ්‍රීලපාහ සෙ/315305 සැරයන් දසනායක එල්ඒ ගේ දියණිය හසිනි සයුරංගි දසනායක



2013 ජුනි මස 15 දින දෙවන උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ සෙ/318112 කෝප්‍රල් මහින්දසේන එම්එම්ආර් ගේ දියණිය සංයුක්ති යුමේෂා



2013 අගෝස්තු මස 02 දින හත්වන උපන් දිනය සැමරූ 10 ශ්‍රීලපාහ සෙ/315471 කෝප්‍රල් ප්‍රේමරත්න අයිසීඑන් ගේ දියණිය දිල්කි හේෂානි නෙත්සරණි



2013 අගෝස්තු මස 27 දින දෙවන උපන් දිනය සැමරූ රේම ශ්‍රීලපාහ සෙ/327044 සාසෙ චන්ද්‍රකුමාර එස්එච්සීපී ගේ පුතුණුවන් පංචජ ජනමිතු බිම්සර




2013 අප්‍රේල් මස 27 දින දෙවන උපන් දිනය සැමරූ 2 (සෙව්) ශ්‍රීලපාහ සෙ/2ඩී01352 වර්ණ සැරයන් සුමනරත්නපීපීගේ දියණිය සෙව්මිණි භාග්‍යා



2013 මැයි මස 10 දින දෙවන උපන් දිනය සැමරූ 22(සෙව්) ශ්‍රීලපාහ සෙ/22ඩී00041 කෝප්‍රල් විජේසිංහ සීඑම් ගේ පුතුණුවන් අසේන් සහ අෂාන්



අගෝස්තු මස 20 වන දින පළමු උපන් දිනය සැමරූ 12 ශ්‍රීලපාහ සෙ/323585 ලාකෝ ජයවර්ධන ජේඩීඑස් ගේ පුතනුවන් රසංග නෙත්මින



2013 මැයි මස 18 දින දෙවන උපන් දිනය සැමරූ 18 (සෙව්) ශ්‍රීලපාහ සෙ/18ඩී00314 ලාකෝ නුවන් කුමාර ඩබ්ලිව් ගේ පුතුණුවන් නිරෝෂන් කුමාර



2013 අගෝස්තු මස 06 දින පළමු උපන් දිනය සැමරූ 16 (සෙව්) ශ්‍රීලපාහ සෙ/22ඩී00440 සාසෙ දිසානායක ජේඑල්එන් ගේ දියණිය සනුගි දුලත්සා



2013 ජූලි මස 26 දින පළමු උපන් දිනය සැමරූ 15 ශ්‍රීලපාහ සෙ/316002 කෝප්‍රල් පුෂ්ප කුමාර අයිකේඑල් ගේ පුතුණුවන් විරාජ් ප්‍රියලාල්



2013 අගෝස්තු මස 23 වන දිනට පළමු වන උපන් දිනය සැමරූ 10 ශ්‍රීලපාහ සෙ/317345 කෝප්‍රල් රුවන් කුමාර ඒකේආර් ගේ පුතණුවන් රැක්ෂාන් කවිශ්ක.







2013 ජුනි මස 16 දින දෙවන උපන් දිනය සැමරූ 7 ශ්‍රීලපාහ සෙ/318038 කෝප්‍රල් සුරසේන එස්ඩබ්කේඩීආර්බී ගේ පුතුණුවන් දෙනේෂ් පැහැසර



2013 අගෝස්තු මස 03 දින දෙවන උපන් දිනය සැමරූ 6 ශ්‍රීලපාහ සෙ/304759 බනි II චුලවංශ එච්එච්එස් ගේ දියණිය පබෝධි ආකෂා



2013 ජුනි මස 10 දින දෙවන උපන් දිනය සැමරූ නි/67732 ලුතිතන් එස්එර්එච්එච් පෙරේරා ශ්‍රීලපාහ ගේ දියණිය එලීෂා ඇන්ජලා



2013 සැප්තැම්බර් මස 25 දින පස්වන උපන් දිනය සැමරූ 19 ශ්‍රීලපාහ සෙ/306117 බනි II කොඩිතුවක්කු කේඑච්ආර් ගේ දියණිය දෑහැමි පහන්යා



2013 සැප්තැම්බර් මස 29 දින අටවන උපන් දිනය සැමරූ 12 ශ්‍රීලපාහ සෙ/309837 වර්ණ සැරයන් ආනන්ද ආර්කේඑම් ගේ පුතුණුවන් ධනුජ හිමාෂ


2013 සැප්තැම්බර් 27 දින පස්වන උපන් දිනය සැමරූ 2 (සෙව්) ශ්‍රීලපාහ සෙ/2ඩී02795 කෝප්‍රල් වීරසිංහ ඊඩීඑස්කේ ගේ පුතුණුවන් චමොද් මදුසංක


2013 ජූනි මස 30 දින සවැනි උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ සෙ/313920 සැරයන් හේරත් එච්එම්එල්එම් ගේ පුතුණුවන් කවිඳු මදුෂාන්


2013 ජූනි මස 16 දින තෙවන උපන් දිනය සැමරූ 1 ශ්‍රීලපාහ සෙ/313906 සැරයන් මිල්ටන් කේඑච් ගේ පුතුණුවන් අදීෂ උෂාන් රාජපක්ෂ


2013 අගෝස්තු මස 18 දින තුන්වන උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ නි/68426 ලුතිනන් එච්එම්පී පුදීප් කුමාර ශ්‍රීලපාහ ගේ දියණිය නිමේෂා චතුරි


2013 අගෝස්තු මස 03 දින දෙවන වසර උපන් දිනය සැමරූ 10 ශ්‍රීලපාහ සෙ/324039 ලාකෝ ඒවරත්න ඒචිකේ ගේ දියණිය පුතිභා බුද්ධිනි


2013 සැප්තැම්බර් මස 16 දින පළමු උපන් දිනය සැමරූ රෙජිමබ ශ්‍රීලපාහ ඒකකයේ සෙ/14ඩී00440 ලාකෝ ඩයස් ජේකේ ගේ දියණිය සෙනුරි නවෝද්‍යා


2013 ජූනි මස 11 දින පස්වන උපන් දිනය සැමරූ රෙම ශ්‍රීලපාහ සෙ/307368 වරණ සැරයන් පෙරේරා ඩබ්ලිව්එම්එම්සී ගේ දියණිය චමත්කා දෙව්මිනි


2013 මැයි මස 31 දින පලවන උපන්දිනය සැමරූ 25 ශ්‍රීලපාහ සෙ/326833 සාසෙ ප්‍රියදර්ශන ඊඩබ්ලිව් ගේ දියණිය සෙතුමිලි නෙවිහාරා


2013 ජූලි මස 28 දින දෙවන උපන් දිනය සැමරූ රෙජිමබ ශ්‍රීලපාහ සෙ/317281 කෝප්‍රල් ලලිත් ටීඑච් ගේ දියණිය නිදුකි උනෙත්මා සහේලි


2013 අගෝස්තු මස 18 දින හතරවන උපන් දිනය සැමරූ 15 ශ්‍රීලපාහ සෙ/310862 කෝප්‍රල් ධම්මික පීජීඑම් ගේ දියණිය රිෂ්මි පාරින්ධ්‍යා


2013 මැයි මස 21 දින දෙවන උපන් දිනය සැමරූ 8 ශ්‍රීලපාහ සෙ/325945 ලාකෝ වික්‍රමසිංහ එස්සී ගේ පුතුණුවන් ලෝචන නෙත්සර

2013 අගෝස්තු මස 29 වන දිනට පළමු උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ සෙ/319104 කෝප්‍රල් හෙන්නායක එච්එම්ඩී ගේ පුතුණුවන් යසාර රුසිරු යහසිත්





2013 අගෝස්තු මස 26 දින තුන්වන උපන්දිනය සැමරූ 11 ශ්‍රීලපාහ සෙ/330355 කෝප්‍රල් දිවුල්වැව ආර්එම්එස්කේ ගේ ආදරණීය පුතුණුවන් සිතුක දෙව්මිණ


2013 ජූලි මස 14 දින තුන්වන උපන්දිනය සමරන 25 ශ්‍රීලපාහ සෙ/317813 කෝප්‍රල් සමරකෝන් එස්එම්යූබී ගේ ආදරණීය පුතුණුවන් තරුෂ නෙත්සර


2013 අගෝස්තු මස 29 දින දෙවන උපන් දිනය සැමරූ 11 ශ්‍රීලපාහ සෙ/330774 ලාකෝ පුෂ්පකුමාර කේඑස් ගේ පුතුණුවන් ගෙනේස් සෝමය ලෝචන


2013 ජූලි මස 07 දින තෙවන උපන් දිනය සැමරූ 14 (සෙව්) ශ්‍රීලපාහ සෙ/14ඩී00996 ලාකෝ වීරකෝන් ඩබ්ලිව්එම්පී ගේ දියණිය රශ්මි ෂෙහාරා


2013 ජූනි මස 24 දින දෙවන උපන් දිනය සැමරූ 15 ශ්‍රීලපාහ සෙ/310597 සැරයන් වසන්ත කුමාර ඊ ගේ පුතුණුවන් චමත්ක දෙනෙසර



10 ශ්‍රීලපාහ විධායක අධිකාරී
නි/68244 ලුතිනන්
එස්ජීආර්ආර්පී කුමාර ශ්‍රීලපාහ



15 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරී
නි/68807 ලුතිනන් එම්එල්එස්
මද්දුමාගේ ශ්‍රීලපාහ



10 ශ්‍රීලපාහ බුද්ධි නිලධාරී
නි/69137 ලුතිනන්
බීපීඑම්කේජේ වීරරත්න ශ්‍රීලපාහ



7 ශ්‍රීලපාහ රෙජිමේන්තු සැරයන්
මේජර් සෙ/302629
බනි 1 ජේපීජේ බංඩාර

**සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්...**



10 ශ්‍රීලපාහ රෙජිමේන්තු
සැරයන් මේජර් සෙ/303815
බනි 1 එම්ජ් බන්දුසේන



20 ශ්‍රීලපාහ රෙජිමේන්තු
සැරයන් මේජර් සෙ/305210
බනි 1 ඩබ් ගුණවර්ධන



12 ශ්‍රීලපාහ රෙජිමේන්තු
සැරයන් මේජර් සෙ/304002
බනි 11 ජයරත්න පීඑච්



15 ශ්‍රීලපාහ රෙජිමේන්තු
සැරයන් මේජර් සෙ/303971
බනි 11 විජේබණ්ඩාර එස්



26 ශ්‍රීලපාහ උපකරණ පාලක
සැරයන් මේජර් සෙ/304287
බනි 11 කපුකොටුව එම්ඩී



15 ශ්‍රීලපාහ උපකරන පාලක
සැරයන් මේජර් සෙ/13248
බනි 11 පෙරේරා එච්එච්ඩී



10 ශ්‍රීලපාහ සරබ උපදේශක
සෙ/307313
බනි 11 විජේරත්න ඩබ්එම්



10 ශ්‍රීලපාහ ප්‍රධාන ලිපිකරු
සෙ/306216 බනි 11
ජයසිංහ එච්එච්එන්



12 ශ්‍රීලපාහ සරබ උපදේශක
සෙ/310291
වර්ණ සැරයන් ප්‍රේමසිරි ඩබ්ජ්



24 ශ්‍රීලපාහ සරබ උපදේශක
සෙ/313862 සැරයන්
පිටවල ඩබ්ලිව් ආර්ඩීඑල්



5 (සෙව්) ශ්‍රීලපාහ ප්‍රධාන
ලිපිකරු සෙ/5ඩී01571 සැරයන්
රංජිත් කුමාරසිංහ ඒපී

# 11 ශ්‍රීලපාහ පුවත්

## සවැනි බළඇණි දින සංවත්සරය

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු කඳවුරු පරිශ්‍රය තුළදී 2007 ක්වූ ජුනි මස 25 දින අභිමානවත් ලෙස පිහිට වූ 11 ශ්‍රීලපාහ 06 වන සංවත්සරය සමරනු ලැබුවේ උත්සවමලාවකිනි. මෙම ඒකකය වන්නි මානුෂිය මෙහයුමේදී උදාර මෙහෙවරක් කරමින් රුදුරු ත්‍රස්තවාදය ශ්‍රී ලංකාද්වීපයෙන් මුලිනුපුටා දැමීමට දායක විය. එම කාර්යයේදී නිලධාරින් සහ සෙසුනිලයින් 205 දෙනකු දිවිපුදා තවත් 989 ක් තුවාල ලබා ඇත.

මෙම ඒකක අණදෙන නිලධාරි නි/62252 ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ සංකල්පයක් මත ඒකක දෙවන අණදෙන නිලධාරි සියලුම නිලධාරින් හා සෙසුනිලයින්ගේ පූර්ණ දායක්වය මත රට ජාතිය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් වෙනුවෙන් හා අබාධිත තත්ත්වයට පත් රණවිරුවන් හට ඉක්මන් සුවය පතා ඔවුන්ගේ දෙමාපියන්, බිරින්දෑවරුන්, ළමුන් හා ඥාතින් සහභාගි කරවාගෙන දානමය පිංකමක් 2013.06.20, 21 දිනයන් හිදී 11 ශ්‍රීලපාහ කරෙයිනගර් යුද හමුදා කඳවුරු පරිශ්‍රයේදී සිදු කරන ලදී. මුලින්ම 20 වන දින ඥාතින් සහභාගි කරවාගෙන ඔවුන් යාපනය නාගදීපය වැද පුදා ගැනිම සඳහා චාරිකාවක් රැගෙන යන ලදී. ඉන් පසුව සංඝයා වහන්සේලා දස නමක් වඩම්මවා ඓතිහාසික දඹකොළ පටුන විහාරස්ථාන භූමියේදී බෝධිපූජාවක් පවත් වන ලදී. ඒ සඳහා 513 බළසේනාධිපති හා 51 සේනාංකයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහභාගි වූහ. පසු දින කඳවුරු භූමියේදී සංඝයා වහන්සේලා දස නමක් සඳහා දහවල් දානය පූජා කළහ. එම පුණ්‍ය කටයුත්ත සඳහා රෙජිමේන්තුවේ හකාස නිලධාරි ලුතිතන් කර්නල් ටීසීකේ පීරිස් ආර්එස්පී ශ්‍රීලපාහ සහභාගි විය.

මියගිය රණවිරුවන්ගේ ඥාතින් රැස්කර ඒකක අණදෙන නිලධාරි තුමන්ගේ ප්‍රධානත්වයෙන් ඔවුන්හට පැණනැගී ඇති ගැටළු පිළිබඳ සාකච්ඡා කොට උපදෙස් ලබාදී ඔවුන්ගේ දුවාදරුවන් වෙත පාසැල් උපකරණ ලබාදීමට කටයුතු කරන ලදී. පාබල හමුදාවක් වශයෙන් මියගිය රණවිරුවන් අප අතුරින් කිසිදා අමතක නොව බව පෙන්වා කෘතගුණ සැලකීම නැමති මානුෂිය ගුණාංගය වඩාත් ඉස්මතු කරන්නක් බවට මෙම ඒකක නිලධාරින් හා සෙසුනිලයින් පසක් කරමින් පිංකම් මාලාවේ වැඩ අවසන් කරන ලදී. **''රට දැය වෙනුවෙන් දිවිපිදූ දයාබර වූ රණවිරුවනේ ඔබ නමින් අප ඔබගේ ආදරණිය ඥාතින් සදාකල් හි රැක බලා ගන්නට පෙළ ගැසෙමි''**

මෙම ඒකකය ආරම්භ කර වසර 6 ක් පිරීම නිමිතිකොට ගෙන ඒකක අණදෙන නිලධාරි හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාළියක් පිරිනමන ලදී. එහිදී අණදෙන නිලධාරි සියලුම නිලයින් අමතමින් කියා සිටියේ ඒකකයේ උන්නතිය වෙනුවෙන් තම උපරිම දායකත්වය ලබාදී රෙජිමේන්තුවේ







බබළවන ඒකකය බවට හිමි කීර්ති නාමය ලබාදෙන බවත්, ඒ සඳහා සියලුම දෙනාගේ උපරිම දායකත්වය ලබාදෙන ලෙස දන්වා සිටින ලදී.

එදින සියලු නිල භෝජන සංග්‍රහයක් පවත්වා රාත්‍රියේ හා පසු දින රාත්‍රියේ නර්ථන කණ්ඩායමක් සහභාගි කර ගනිමින් අලංකාර සංගිත රාත්‍රියක් පවත්වන ලදී. දිනෙන් දින ඉදිරියටම යන 11 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට පාබල හමුදා මැණියන්ගේ ආරක්ෂාව ලැබේවා යැයි එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

**බුද්ධි අංශය - 11 ශ්‍රීලපාහ**





# 5 (සෙව්) ශ්‍රීලපාහ පුවත්

## ප්‍රජා සත්කාර

5 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් යාපනය අච්චුවේලි ප්‍රදේශයේ ජීවත් වන සිවිල් වැසියන්ගේ ජන ජීවිතය ගොඩ නැංවීමේ අරමුණින් ස්වයං රැකියාව පවත්වාගෙන යාම සඳහා ඔවුන් හට අවශ්‍ය දෑ ලබාදීමේ වැඩසටහනක් මෙම ඒකක අණදෙන නිලධාරිගේ ප්‍රධානත්වයෙන් යාපනය අච්චුවේලි මධ්‍ය මහ විද්‍යාලීය ක්‍රීඩාංගනයේදී පැවැත්වුනි.

මෙම ඒකක අණදෙන නිලධාරිගේ ඉල්ලීම මත රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස් හෙට්ටිආරච්චි මහතා සහ නෙදර්ලන්ත ඇලුමිනායි සහයෝගිතා සංගමය මූල්‍ය දායකත්වය මත අච්චුවේලි ප්‍රදේශයේ ජීවත් වන දිළිඳු පවුල් වෙනුවෙන් කිරි ගවයින් 16 දෙනෙකු, එළු පැටවුන් 07 දෙනෙකු සහ කුකුළන් 100 දෙනෙකු ද, කාන්තාවන් 11 දෙනෙකු වෙනුවෙන් මහන මැෂින් ද, අච්චුවේලි ගොවි පවුල් 02 ක් වෙනුවෙන් ජල පොම්ප 02 ක්ද, ලබා දීමේ උත්සවය අච්චුවේල මධ්‍ය මහා විද්‍යාලයේදී පවත්වන ලදී. මේ සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආසේමු (යා) ආඥාපති මේජර් ජෙනරල් මහින්ද හතුරුසිංහ ආර්එස්පී එන්ඩීසී අයිජී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගි විය.










බුද්ධි අංශය 5 (සෙව්) ශ්‍රීලපාහ

# Great Escape



Looking at the poor wary humans
Making a desperate bid towards liberation
Amidst gun fire and scorching heat
Traversing on dusty paths

One's Mind goes back to the 'Exodus'
Mentioned in the Holy Bible
Moses took forty long years
To free the Israelis
From Egyptian slavery and lead them
To the Promised Land
Wending through sea and desert

Israelites loosed from
Pharos bitter yoke
Led them with unmoistened foot
Through the rough sea waters
Fed with manna from heaven

These humans are fleeing themselves
From the illusory Paradise
Sans food and bare essentials
Dependent on the mercy and
Compassion of other brethren

Waves of starving Humanity
Struggling hard to cross through the clam lagoon
To the other side in the scorching heat and rain
Reminiscent of 'Cassanda Crossing'
Trying hard to survive the onslaught
Being utilized as a human shield
In the final battle for supremacy

Bidding 'Aurevior' to the epoch
Of countless deaths, wasted energy
And misery of twenty five years
Visualizing the Dawn of a new lease of life

The soldiers awaiting them
With out stretched arms
In their new role of a mission of mercy
To assist them in their quest
For a fresh lease of life (Nouveau Vie)
Which appears grim, uncertain
Or full of apprehensions at the moment
Though, relief, reconstruction and reconciliation
Are in full swing
All praise and admiration goes
To the valiant compassionate soldiers
Who are devoted, determined in their novel role
as angles of mercy.

**Camillus Fernando,**
Weli**kadamulla, Mabole, Wattala.**

# රෙජිමුබ ශ්‍රීලපාහ පුවත්

## රණක්ෂයටපත් විරුවන්ට ලද දැනුම් උල්පත



වසර 30 කට අධික කාලයක් අප මාතෘභූමිය ත්‍රස්තවාදී ග්‍රහණයට ලක්ව තිබූ අවදියක රට ජාතිය බේරා ගැනිමේ අධිටනින් යුතුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳි ශ්‍රී ලංකා පාබල හමුදා මැණියන් යටතේ අත්වැල් බැද ගනින් උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරින්හි නියැලෙමින් සිටියදි ම්ලේච්ඡ කොටි ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයන්ට ලක්ව විවිධ ආබාධිත තත්ත්වයන්ට පත් වීමෙන් පසු වෛද්‍ය වර්ග කිරීම් මත රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත 2200 කට ආසන්න පිරිසක් තම සිවිල් ජීවිතයටද උපයෝගි කරගත හැකි විවිධ ක්‍රියාකාරකම් වලට යොදවා ඇත.





මෙම විවිධ ආබාධ සහිත වූ වීරෝදාර සෙබළුන්ගේ දැනුම් සම්භාරය තව තවත් වර්ධනය කිරීමටත්, ඔවුන්ගේ මානසික හා ආධ්‍යාත්මික සුවය නංවාලනු පිණිසත්, කුඩා දියණියක් ඉදිරිපත් විය. පියා වූ හේලීස් සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂක අසංක රත්නායක මහතා සහ මවවූ චිත්‍රාංගනි රත්නායක මහත්මියගේ ආදරණීය දියණිය වන ජනිෂා රත්නායක මෙම පරිත්‍යාග ශීලි දියණියයි. මෙම මහඟු සත්කාරය සඳහා ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ චේතිය ගුණසේකර මැතිතුමාගෙන් නොමද සහයක් ලැබිණි.

කොළඹ මියුසියස් විද්‍යාලයේ 23 වෙනි කොළඹ බාල දක්ෂිකා කණ්ඩායමේ සාමාජිකාවක් වන මෙම දියණිය බාල දක්ෂිකා කණ්ඩායමේ ''ප්‍රජා සේවා ව්‍යාපෘතිය'' නමින් 2013 ජුනි මස 22 වන දින මෙම බළඇණිය වෙත ව්‍යාපෘතිය සාර්ථක කර ගනිමින් හා විශාල පුණ්‍ය කර්මයක් සිදු කර ගනිමින් පොත් පරිත්‍යාග කරන ලදී.

එවකට යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි සහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් මෙම සත්කාරය ආරම්භ විය. පැමිණි සිටි සියලුම දෙනා රෙජිමුබ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්ජ්ආර් ගුණසේකර ආර්එස්පී ශ්‍රීලපාහ විසින් අමතමින් පිළිගැනිමේ කථාව සිදු කරන ලදී. ඉන් අනතුරුව විවිධ අංශ යටතේ (නව කතා, කෙටි කතා, බෞද්ධ පොත් හා ඉතිහාස පොත් ආදීය) පොත් 1250 කට ආසන්න ප්‍රමාණයක් රණවිරුවන්ගේ පරිහරණය සඳහා පරිත්‍යාග කරන ලදී. ඉන් නොනැවතී පරිඝණකයක් හා විවිධ ඉසව් ආවරණය වන පරිදි ඩීවීඩී සංයුක්ත තැටි 300 කට ආසන්න ප්‍රමාණයක්ද පරිත්‍යාග කළේය.

පරිත්‍යාග ලබාදීමෙන් අනතුරුව මෙම සංකල්පයේ නිර්මාතෘ ජනිෂා රත්නායක දියණිය හා එයට සහාය දුන් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ චේතිය ගුණසේකර මහතාත් සියලු දෙනා අමතා කතාවන් සිදු කළහ. ඉන් අනතුරුව රෙජිමේන්තු නර්තන කණ්ඩායම විසින් සම්ප්‍රදායික නර්තනාංග යක් සියලු දෙනා අභිමුව දිගහැර දක්වන ලදී. මෙම සත් කාරය සිදු කළ ජනිෂා රත්නායක දියණියටත්, චේතිය ගුණසේකර මහතාටත්, කෘතගුණ සැලකිමක් ලෙස සමරු තිළිණයක් රෙජිමේන්තු අධිපති අතින් පරිත්‍යාග කරන ලදී.

එය අවසානයේ ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් ඉතාමත් කාලෝචිත කථාවක් පැවැත්වීමෙන් අනතුරුව සියලු දෙනා එක්ව රෙම ශ්‍රීලපාහ නිලධාරි නිවස්නයේ සකස් කර තිබූ තේ පැන් සංග්‍රහය භුක්ති විදීමෙන් අනතුරුව රෙජිමුබ ශ්‍රීලපාහ සෙබළුන් ලද දැනුම් උල්පතේ වැඩ සටහන් නිමාව දකින ලදී.

මෙම මා හැගි සත්කාරය සාර්ථකව ඉටු කරගැනීමට මූලස්ථාන බළඇණියේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලයින් ල්බාදුන් සහයෝගයත්, මෙම කර්තව්‍ය වෙනුවෙන් මූලිකත්වය ගෙන කටයුතු කළ බ්‍රිගේඩියර් කේපීඑච්එස්කේ ඇඹව ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී, ජනිශා රත්නායක දියණියටත්, ඇයගේ දෙමාපියන්ටත්, චේතිය ගුණසේකර මැතිතුමාටත් ඔවුන්ගේ ඉදිරි ජීවන කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක කරගැනිමට ශක්තිය ධෛර්යය ලැබේවායි අපි මුලු හඳවතින්ම ප්‍රාර්ථනා කරන්නේමු.



බුද්ධි අංශය රෙජිමුබ ශ්‍රීලපාහ

# මගේ සඳ ඔබය

මාස 03 ක් ඉකුත්වී
ගෙවුනු කාලය හුදකලාවම
නැත ඉඩක් ලැබුනේ
මට රැඳෙන්නට
ඔය නෙතු අද්දර
මොහොතකටවත්
අහිමිද ඔබේ සෙනෙහේ
මට තුරුළුව වන්නට ඔය පපුතුරට
මග බලා සිටියා ඉදින් දින ගනන්
බංකරය තුළට වෙලා
ගිනි අවිය නෑයෙක් වෙලා
කඳවුරම නිවහන වේවිද
මට කියන් කුමරියේ
කොතෙක් කල් පෙරුම් පිරුවාද
ඔබ මගේම පෙම්වතිය කර ගන්නට
මගේ කුමරිය දැන් නුඹ මගේමය
මේ ආත්මයේ දී නොව
ලැබෙන හැම ආත්මයකම
ඔබ මගේම පෙම්වතිය වේවා

**සාසෙ අබේකෝන් එම්එම්එස්පී**
**18(සෙව්) ශ්‍රීලපාහ - 'සී' කණ්ඩායම**

# සිරව ගිය ගී පද



තුරුලු මුව රකියි මුණිවත
ගහ කොලද - නිසල වී
සුසුම්ලත් - වා තලය
නිරතුව හඬ නගා
කියන්නට හැක
ඇසෙන සේ සක්වලට
දයාබර ... මැණියනි
මැණියනි මැණියනි මගේ

දු පුතුන් තනන්නම දූරු
තැන අනන්තය
නෑ ගුනය අචින්තය
බුදු සමිදු පිදු සිත
භක්තියෙන් අනුනය
මැණියනි මගේ සෙනෙහෙබර
නිවන් මග නියතය

අපගෙන් සදා වෙන්ව
මෙලොව හැර ගිය
මගේ ආදරණීය අම්මා වෙනුවෙනි

**සාසෙ කිත්සිරි කේඑම්යු - 12 ශ්‍රිලපාහ**
**අභිමංසල II සුව සහන මධ්‍යස්ථානය**
**කඹුරුපිටිය**

# අපේ රට

සුන්දරයි අපේ රට
සිහිල් ගඟුලැල් ගලන
ගිරිහෙල් කඳු දුර්ග ද
වන මල් ගහන
පොළවෙන් වුතු මැණික්
මතු පිට පතිත
අපේ මව් භූමිය ලෙසින්
කඳුලින් තෙමන
යුගයෙකුයි නිම කලේ
සිව් මහ විරු රැන
පිං දෙනවා විරුවනි
ඔබට අප හැමදාම
මා වැනි බිරිදන්ව සදහටම
තනි නොවන
යුගයක් එළඹිලා සැවොම
එක්සත් කම රදන
එක්වෙමු හෙට දිනේ
අත දෙන්න රට හදන

1976.06.06 දිවි පිදු 6 ශ්‍රීලපාහ සෙ/13850 සැරයන් තිලකරත්න එම් බිරිද කේ මාවඩවිලගේ විසිනි

# ජීවිතේ ගමනක් නම්

ගමනෙ කෙලවරක් තෙක් ඇවිද යන්නට
ගල් බොරළු නැති වැට කඩුළු නැති
පැහැදිලි මාවතක් නැති එහෙත්
කවදා හෝ දවසක අහස තෙක් ඉමි
සිඟින මල් පිපුණු තුරු මුදුන්
මිහිදුම් දවටුණු සොඳුරු ඇස
ගැටෙන්නට නම් ගල් බොරළු මගින්
යටිපතුල් රිදෙන්නට පා බිම කබා යා යුතුය මා ...

**ලාකෝ ජයසේකර කේආර්ජේ**
**12 ශ්‍රීලපාහ - ඩී කණ්ඩායම**


# මගේ පුතා

මේ පාලු කතරේ සිරි මුවද ගලා ඉතිරි යන්නට
පුතෙකුගේ සිනහව මගේ සවන සන සන්නට
ඇයගේ ප්‍රේමයෙන් යලි ලබන්නට
පිංමදි සංසාරේ පුතෙකුට පියෙකු වන්නට

**ලාකෝ ගයාශාන් ඒජී**
**පාලන කණ්ඩායම - 24 ශ්‍රිලපාහ**




# අභිමානවත් චරිතයක ගති ලක්ෂණ



අලුයම පිබිදීමට ආශා කරයි
තමා හා අවට පිරිසරය පිරිසිදුව තබාගනි
හැම වැඩක්ම ක්‍රමානුකූලව කිරීමට උත්සහ කරයි
ගෞරව කළ යුත්තාට මුලු හදින්ම ගෞරවය කරයි
ආරම්භ කළ කටයුත්ත නිමාව දක්වා කිරීමට දරයි
සැමට ප්‍රිය මනාපවෙයි
අනතුර කල් ඇතිව හදුනාගනි
වචනය ප්‍රවේසම් කරයි (ඕප දූප කථා නොකරයි)
අප කිර්තියට බිය වෙයි
ප්‍රශ්න හමුවේ ඉවසිලිමත් වෙයි
උපදෙස් වලට සවන් දෙයි
තම සේවය අවංකව උපරිම අයුරින් ඉටුකරයි
කාලය අපතේ නොයවයි
අද වැඩේ හෙටට නොතබයි
පොරොන්දු කඩ නොකරයි

**විශ්‍රාමික වර්ණ සැරයන් ධර්මදාස මොහොට්ටිගේ**
**දිවයිනටම සාම විනිසුරු**

# ඈ

නුඹත් එක්ක අත් බැදගෙන
ඇවිදින් ගිය මල් පාරේ
මං ආවා විදගන්නට
මතක සුවඳ අතිතයේ
පුරුදු සුවඳ හදට දැනි
නෙත් හැර බැලූවිට මාගේ
ඔහුත් එක්ක නුඹ ඇවිදන්
අත් පටලන් යයි පාරේ
ගහ වැල මල් තව එහෙමයි
නෑ වෙනසක් එවායේ
මගේ ආදරේ තව නුඹටයි
දැවුවත් නුඹ හිත මාගේ
මේ භවයේ දුර ගියාට
යලි උපදින සංසාරේ
මං ඉන්නම් නුඹ එනතුරු
මඟ බලාන මේ වාගේ

ලාකෝ මද්දුම බණ්ඩාර එච්එම්
බුද්ධි අංශය - 7 ශ්‍රීලපාහ

# අවසන් නිගමනය

මිනිසුන් නිතර තර්කානුකුල නොවන ආසාධාරණ හා ආත්ම කේන්ද්‍ර වේ. කෙසේ වුවත් ඔවුන්ට සමාව දෙන්න. ඔබ කරුණාවන්ත නම් මිනිසුන් ඔබට චෝදනා කරාවි ආත්මාර්ථකිමියා ලෙස එසේ වුවත් කරුණාවන්ත වන්න. ඔබ සාර්ථක නම් ඔබට හමුවේවි හොඳ යහලුවන් මෙන්ම නරක යහලුවනුත් එසේ වුවත් දිගටම සාර්ථක වන්න. ඔබ ගොඩක් අවංක නම් මිනිසුන් ඔබව රවටාවි. එසේ වුවත් අවංක වන්න ගොඩනැගිම සදහා ඔබ අවුරුදු ගණනක් වියදම් කල දේවල් යමෙකුට එක් රැයකින් විනාශ කල හැක. කෙසේ වුවත් ගොඩ නගන්න. ඔබ සතුට හා සැනසුම ලබයි නම් ඔවුන් ඔබට ඊර්ෂියා කරාවි. කෙසේ වුවත් සතුටු වන්න. ඔබ අද කරන හොද මිනිසුන් හෙට වන විට අමතක කරාවි. කෙසේ වුවත් හොද කරන්න.

**ච/සැර අමරසේකර ටීජේපීඑම්**
**පාලන කණ්ඩායම 4 ශ්‍රීලපාහ**

දහසක් පැතුමන් සිතින් ගෙන
නුහුරු සන්තාශයක් ගත දරා
රුදුරු රුපු දනන්ගේ බල බිඳින්නට
ඔබගේ ඇණියට පිවිසියේ
අල්පශ්‍රැතියෙකු ලෙසින මා එදා...

වරක නායක තේජසින් නොව
පෙන්වූ දයාව අප සැමට
නබෝ ගැබ ලෙසින් නුඹ ...
හිඩැස නොතබා බලඇණියේ අප වෙත
ඇත් රුපුණි
පැතුරුවේ පිය සෙනෙහසයි නුඹ...

නිබඳ පිහිට වෙනු සරණ ඇවිසියන් වෙත
අදින් කඟපත එරහිව
වැරිදිකරුවනට
දුන්නු ඔවදන් පෙන්වූ එමග
තබමි පියවර අදත් මා...

වයා රණබෙර ගයා රණ ගී
ලෙළ දෙනවා නුඹතල හී රණ ධජ
එයයි අභිනන්දනය අද...
සතුරු රුධිරය මතින් එඩිගෙන
මෙතෙක් ආ මග ජය ලබන්නට
මා විවරණය ලැබූ ඔබෙන්...
සෙන්පති ලෙස ඉදිරි මෙහෙවරටත්
වියතාණෙනි මාගේ ප්‍රථම නියමුවාණෙනි
වර පතමි මා මතුවටත්
ඔබගේ දෙනෙතින් ලොව දකින්නට...

සෙ/319573 කෝප්‍රල් තරංග ඩීඑම්ඩී
10 ශ්‍රීලපාහ



# දසුනේ හසුන

**ගුරු ගෝල එක තැන**
**එදා සිටියේ එලෙ සින**
**දකින විටදී අද දින**
**අපට නිම්හිම් නැතිය නිති දෙන**

සෙ/306464 වර්ණ සැරයන් චන්ද්‍රතිලක බීපීඑස්කේ
තූර්ය වාද්‍යක කණ්ඩායම රෙම ශ්‍රීලපාහ

දසුන : වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ

## ප්‍රහේලිකා අංක 57 - 77 වන වයිට් හැකල් සඟරාව

නිවැරදි විසඳුම්පත් 2014 ජනවාරි මස 15 වන දිනට පෙර එවිය යුතුය.

තරඟ කූපනය සහ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

### වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 57

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 3 | 1 | 4 | | 5 | 6 | 9 | |
| 5 | 9 | | | 7 | | | 2 | 4 |
| 6 | | | 3 | | 9 | | | 1 |
| 7 | | 2 | 6 | | 4 | 9 | | 5 |
| | 5 | | | 1 | | | 4 | |
| 4 | | 6 | 5 | | 7 | 2 | | 8 |
| 8 | | | 9 | | 1 | | | 2 |
| 1 | 6 | | | 5 | | | 8 | 9 |
| | 2 | 5 | 7 | | 8 | 1 | 6 | |

**ප්‍රහේලිකාව ගැන...**

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.
2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.
3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.
4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.
5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.
6. කුඩා කොටුවක් තුළ හෝ සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

# වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 54

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 9 | 1 | 8 | 5 | 2 | 7 | 6 | 3 | 4 |
| 7 | 3 | 2 | 8 | 4 | 6 | 1 | 9 | 5 |
| 6 | 4 | 5 | 1 | 9 | 3 | 2 | 7 | 8 |
| 4 | 2 | 9 | 6 | 1 | 5 | 3 | 8 | 7 |
| 1 | 7 | 3 | 2 | 8 | 9 | 4 | 5 | 6 |
| 5 | 8 | 6 | 7 | 3 | 4 | 9 | 1 | 2 |
| 2 | 5 | 1 | 3 | 6 | 8 | 7 | 4 | 9 |
| 8 | 6 | 4 | 9 | 7 | 1 | 5 | 2 | 3 |
| 3 | 9 | 7 | 4 | 5 | 2 | 8 | 6 | 1 |

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරගයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරේ වම් පස උඩ කෙලවරේ වයිට් හැකල් ප්‍රහේලිකා අංක 57 යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙම ශ්‍රීලපාහ,
යුද්ධ හමුදා ජනපදය,
පනාගොඩ, හෝමාගම.

## මෙවර ජයග්‍රාහකයෝ

ප්‍රථම ස්ථානය

සෙ/316007 කෝප්‍රල් සිසිර කුමාර එම්ඩීපී
රෙජිමූබ ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම

දෙවන ස්ථානය

සෙ/314306 කෝප්‍රල් සුසන්ත පීඑන්
රෙජිමූබ ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
පනාගොඩ - හෝමාගම

තුන්වන ස්ථානය

සෙ/318533 ලාකෝ සිරිසෝම ආර්එම්
මූලස්ථානය 8 ශ්‍රීලපාහ
යුද හමුදා කඳවුර
අහුම්ගම්මන - දෙල්ගොඩ

## වයිට් හැකල් ප්‍රහේලිකාව

**57**

### කූපනය

අංකය : ..........................................................

නිලය : ..........................................................

නම : ..........................................................

රාජකාරී ලිපිනය : ..........................................................


..........................................................

..........................................................

ඒකකය : ..........................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................

# WAR HEROES MEMORIAL
# SRI LANKA LIGHT INFANTRY



අප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාණදානයෙන් ඇප කැප වූ නිලධාරීන් හා සෙබළුන් සදා අනුස්මරණය කිරීම සඳහා රෙජිමේන්තු අධිපතිතුමන් ගේ සංකල්පයකට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ජ්‍යෙෂ්ඨ සේවා අත්දැකීම් ඇති විශ්‍රාමිකයින් හා සියළුම සෙබළුන්ගේ දිරිමත් කිරීම් හා ශ්‍රම ධන පරිත්‍යාගයෙන් යුතුව ඉදි වන රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු සිදු වන ආකාරය ඡායාරූපවලින් දැක්වේ.







ශ්‍රී ලංකා පාබල හමුදාව රටේ භෞමික අඛණ්ඩතාවය සුරකීම වස් අනුපමේය මෙහෙයක් සිදු කරන ලදී. එම සේවය ඉටු කිරීමේදී තම ජීවිතය දෙවැනි කොට රාජකාරි කළ රණවිරුවන් අතුරින් මියගිය රණවිරුවන් සැමරීමට කඳවුරු පරිශ්‍රයේ රණවිරු ස්මාරකයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව දැනට ඉදි වෙමින් පවතින රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් කටයුතු නිම කිරීමට ඇවැසි මුදල් සපයා ගැනීමේ අරමුණින් ''පාබල මේලා 2013'' වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2013 දෙසැම්බර් මස 19 වන දින සිට 23 වන දින දක්වා හික්කඩුව මහජන ක්‍රීඩාංගනයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

2013 සැප්තැම්බර් මස 25 වන දින රෙජිමේන්තු පුහුණු පාසල බූස්ස හිදී පළමු සාකච්ඡාවක් පවත්වනු ලැබීය. රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේ්ඩීජ් කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පවත් වන ලදී.




## පාබල මේලා 2013 වෙළඳ ප්‍රදර්ශනය සහ සැණකෙළිය



# විසිවන යුද්ධ හමුදාධිපතිතුමාගේ රෙම ශ්‍රීලපාහ සංචාරයේදී

